# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,918 — 1970 අගෝස්තු 7 වැනි සිකුරාද — 1970.8.7

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)



| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1099 | කොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 1123 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1112 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 1113 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... ... | 1122 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | 1123 |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 1122 | විවිධ දැන්වීම් ... ... ... ... | — |



## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

දීමනා.—ජෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අනාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ සෑම රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

3. සේවයට සාර ගැසීම පිළිබඳ කොන්දේසි.—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දමිළ පණ්ඩිත ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එකතු කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම සැල සුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥා පනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටමත් රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

**විශේෂ නිවේදනයයි**

**ඉදිරියට** පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. ඩී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම්පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් විසින් එවනු අයදුම්පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් ද එවිය යුතු සි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද මේ අවශ්‍යතාව සපුරාලිය යුතුය. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවය කරන නිලධාරීන් තම අයදුම්පත් ඒ ඒ ප්‍රදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් මගින් ඉදිරිපත් කළ යුතුය.

17. සියලුම අයදුම්පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම්පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7ක් ඇතුළත අයදුම්පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම්කරු ගේ නා සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 ජූලි මස 29 වැනිදා,
කොළඹ 2, මැලේ වීදියේ
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

8–126—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන අමාත්‍යාංශය

### රජයේ ගුරු විද්‍යාලවල පෙරදිග සංගීතය පිළිබඳ උපදේශක–උපදේශිකා තනතුරු

රජයේ ගුරු විද්‍යාලවල පෙරදිග සංගීතය පිළිබඳ උපදේශක–උපදේශිකා තනතුරු සඳහා 1970 අගෝස්තු මස 21 වැනි දින හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් (ගු. වි. ශාඛාව), විසින් ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ.

සැළකිය යුතුයි.—ඉල්ලුම් පත්‍රයක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන්සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුය.

2. වැටුප් ක්‍රමය.—මේ තනතුරු සඳහා නියමිත වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රම පහත දක්වේ :—

(අ) විශ්ව විද්‍යාලයක හෝ ඉන්දියාවේ වෙනත් පිළිගත් ආයතනයක ඩිප්ලෝමාවක් හෝ සහතිකයක් දරන්නන්ට සහ ශ්‍රී ලංකා ලලිත කලායතනයේ සංගීතය පිළිබඳ සාමාන්‍ය සය අවුරුදු පාඨමාලාව හදාරා සාර්ථක ලෙස අවසන් කරන ලද අයට—වර්ෂයකට රු. 4,170—11 × 90 සහ 5 × 144—රු. 5,880 යි ;

(ආ) ගාන්ධර්ව සභාවේ හෝ ශ්‍රී ලංකා ලලිත කලායතනයේ (සිව් අවුරුදු) මධ්‍යම සහතිකය හෝ දරන්නන්ට හෝ වෙනත් විශ්ව විද්‍යාලයක හෝ පිළිගත් වෙනයම් ආයතනයක ඩිප්ලෝමා සහතික පත්‍රයකට පියවරක් වූ මධ්‍යම සහතික පත්‍රයක් දරන්නන්ට—වර්ෂයකට රු. 3,450—17 × 90—රු. 4,980 යි.

3. අවශ්‍ය අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :—

(i) අපේක්ෂකයින් විසින් විෂයයක් වශයෙන් සිංහල සමග ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඒ හා සමාන වෙනත් විභාගයකින් සමත්වී ඉහත 2 වැනි ඡේදය යටතේ නියමිත සුදුසුකම් වලින් එකක් ලබා තිබිය යුතුයි. නැතහොත් යටත් පිරිසෙයින් අ.පො.ස. (සා.පෙ.) විභාගයේ සිංහල භාෂාවෙන් හෝ සාහිත්‍යයෙන් සමත්වී ඉහත 2 වැනි ඡේදය යටතේ නියමිත සුදුසුකම් වලින් එකක් ලබා තිබිය යුතුය ;

(ii) ඉහත 2 වැනි ඡේදය යටතේ නියම කරන ලද අවශ්‍ය වෘත්තීය සුදුසුකම් ඇති, එහෙත් ඉහත 3 (i) යටතේ නියම කරන ලද ශාස්ත්‍රීය සුදුසුකම් ලබා නැති අපේක්ෂකයින් ගෙන් ද ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ. එසේ වුවද, එවැනි අපේක්ෂකයින් පත් කිරීම සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔවුන් පත්වීමේ දිනයේ සිට අවුරුදු තුනක් ඇතුළත අ.පො.ස. (සා.පෙ.) විභාගයේ සිංහල භාෂාවෙන් හෝ සාහිත්‍යයෙන් සමත්වීම අවශ්‍ය වේ ;

(iii) අපේක්ෂකයින් 1970 අගෝස්තු මස 21 වැනි දිනට අවුරුදු 22 ට නොඅඩු හෝ 45 ට නොවැඩි හෝ විය යුතුය. (දැනට රජයේ සේවයේ නියුක්තව සිටින නිලධාරීන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව අදාල නොවේ.)

4. විශේෂ කොන්දේසි :—

(i) තෝරා ගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ගුරු විද්‍යාලයක සේවය කිරීමට බැඳී සිටියි ;

(ii) පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාම නීති යටතේ මෙම තනතුරු විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගැනීමට පළමු විශ්‍රාම වැටුප් වාර්තා යටතේ ගුරුවරුන් වශයෙන් විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන්නන් පත් කරගනු ලැබුවහොත්, එම තනතුරු ඔවුන් විසින් දරනතාක් විශ්‍රාම වැටුප් සහිත යයි ප්‍රකාශයට පමුණුවනු ලැබේ ;

(iii) නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූලව නියමිත ආකෘති පත්‍රයෙහි ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි.

5. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ පළකර ඇති රාජ්‍ය සේවා තනතුරුවලට කාන පත්වීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට ද අවධානය යොමු කරනු ලැබේ.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

අධ්‍යාපන අමාත්‍යාංශය,
මැලේ වීදිය, කොළඹ 2,
1970 ජූලි මස 28 වැනි දින දී ය.

## ආදර්ශ ආකෘති පත්‍රය

### රජයේ ගුරු විද්‍යාලවල පෙරදිග සංගීතය පිළිබඳ උපදේශක–උපදේශිකා තනතුරක් පිළිබඳ ඉල්ලුම් පත්‍රයයි

1. (i) සම්පූර්ණ නම :————.
   (ii) මුලකුරුත් සමග නම :————.
   (මයා., මිය., මෙනෙවිය යන වග සඳහන් කරන්න)

2. ලිපිනය :—
   (i) පෞද්ගලික :————.
   (ii) රාජකාරි :————.

3. (අ) 1970 අගෝස්තු මස 21 වැනි දිනට නිවැරදි වයස :—
   අවුරුදු :————. මාස :————. දින :————.
   (ආ) උපන් දිනය :————.

4. ජාතිය හා එය ලත් අන්දම :————.

5. උපන් ස්ථානය :—
   (අ) ඉල්ලුම්කරු :————
   (ආ) ඉල්ලුම්කරුගේ පියා :————
   (ඉ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————

6 ලබාගත් දින සමග අධ්‍යාපන සුදුසුකම් (ලබා තිබෙන උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික වල පිටපත් ඇමිණිය යුතුය) :————

7 වෘත්තීය සුදුසුකම් (ලබා තිබෙන වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික වල පිටපත් ඇමිණිය යුතුය) :————

8 ඉගෙනීම ලැබූ පාසැල් හා විද්‍යාල (ඇතුළත් වූ සහ අස්වූ දින සඳහන් කළ යුතුය) :————.

9. ඉගැන්වීමේ පළපුරුද්ද (මෙහි පහත දක්වෙන පෝර්මයෙහි විස්තර සඳහන් කරන්න) :—

| පාඨශාලාවේ හෝ විද්‍යාලයේ නම | ඇතුළත් වූ දිනය | අස්වූ දිනය | දරු තනතුරු | සේවා කාලය | | | අස්වීමට හේතු |
|---|---|---|---|---|---|---|---|
| | | | | අ. | මා. | දි. | |

10. සිංහල භාෂාවෙන් ලබා ඇති සුදුසුකම් :————.

11. චරිත සහතික ලබාගත් අයගේ (ඥාතීන් නොවේ) නම් හා නිලතල (සහතික තුනක පිටපත් (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුය) රජයේ සේවකයන් සම්බන්ධයෙන් මෙය අනවශ්‍යය :————.

12. වෙනත් සුදුසුකම් :————.

මවිසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් සඳහන් කර තිබෙන බවට තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත්, මා එයින්ම නුසුදුසු බවට පැමිණෙනවා පමණක් නොව තෝරා පත්කර ගැනීමෙන් පසු ඒ බව දැනගන්නට ලැබුණ හොත් කිසිම වන්දි ගෙවීමක් නොමැතිව මා රාජකාරියෙන් පහකර දමනු ලැබීමට යටත්වන බවද දනිමි.

————.
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

8–128—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන අමාත්‍යාංශය

### දිස්ත්‍රික්ක සේවා ක්‍රමය යටතේ උපාධිධාරී උපගුරුවරුන් බඳවා ගැනීම*

දිස්ත්‍රික්ක ගුරු සේවා ක්‍රමය යටතේ උපාධිධාරී උපගුරු තනතුරු සඳහා ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම ලාංකික උපාධිධාරීන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. 1969.3.28 දින පළවූ අංක 14,847 හා 1970.3.26 දින පළවූ අංක 14,899 දරණ රජයේ ගැසට් නිවේදනවලට අනුකූලව ඉල්ලුම් පත්‍ර එවූ අයදුම්කරුවන් මෙම තනතුරු අපේක්ෂා කරන්නේ නම්, මෙම නිවේදනය අනුව යළිත් ඉල්ලුම් කළ යුතුය. මෙහි පහත දැක්වෙන ආදර්ශ පෝරමය අනුව ඉල්ලුම් පත්‍ර පිළියෙල කොට, අයදුම්කරු නිත්‍ය වශයෙන් පදිංචිව සිටින අධ්‍යාපන දිස්ත්‍රික්කය භාර ප්‍රාදේශීය අධ්‍යක්ෂ/ප්‍රධාන අධ්‍යාපන නිලධාරී වෙත **1970 අගෝස්තු මස 21 වැනි දින හෝ ඊට පෙර** ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. ඉල්ලුම් පත්‍රය බහා එවන කවරයේ වම් ඉහළ කෙළවරේ "උපාධිධාරී උපගුරු තනතුරු" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය. අදාල අධ්‍යාපන දිස්ත්‍රික්ක භාර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරයන්ගේ හා ප්‍රධාන අධ්‍යාපන නිලධාරීන්ගේ රාජකාරී ලිපිනයන් මෙහි පහත සඳහන් වේ.

| අධ්‍යාපන දිස්ත්‍රික්කය | ඡන්දදායක කොට්ඨාශය | අධ්‍යාපන දිස්ත්‍රික්කය භාර නිලධාරියාගේ ලිපිනය |
|---|---|---|
| කොළඹ දකුණ ... ... | (1) දෙහිවල-ගල්කිස්ස | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ග්‍රීන්පාත්, කොළඹ 7 |
| | (2) කොලොන්නාව | |
| | (3) කෝට්ටේ | |
| | (4) මොරටුව | |
| | (5) මැද කොළඹ | |
| | (6) උතුරු කොළඹ | |
| | (7) බොරැල්ල | |
| | (8) දකුණු කොළඹ | |
| හෝමාගම ... ... | (1) අවිස්සාවේල්ල | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, හෝමාගම |
| | (2) හෝමාගම | |
| | (3) කැස්බෑව | |
| | (4) කොට්ටාව | |
| ගම්පහ ... ... | (1) අත්තනගල්ල | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ගම්පහ |
| | (2) වත්තල | |
| | (3) මීගමුව | |
| | (4) කටාන | |
| | (5) දිවුලපිටිය | |
| | (6) මීරිගම | |
| | (7) මිනුවන්ගොඩ | |
| | (8) ගම්පහ | |
| | (9) ජා-ඇල | |
| | (10) දොම්පෙ | |
| | (11) මහර | |
| | (12) කැළණිය | |
| කළුතර ... ... | (1) කළුතර | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කළුතර. |
| | (2) අගලවත්ත | |
| | (3) බණ්ඩාරගම | |
| | (4) බේරුවල | |
| | (5) බුලත්සිංහල | |
| | (6) හොරණ | |
| | (7) පානදුර | |
| | (8) මතුගම | |
| ගාල්ල ... ... | (1) ගාල්ල | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ගාල්ල |
| | (2) බෙන්තර-ඇල්පිටිය | |
| | (3) බලපිටිය | |
| | (4) අම්බලන්ගොඩ | |
| | (5) රත්ගම | |
| | (6) බද්දේගම | |
| | (7) හිනිදුම | |
| | (8) අක්මීමන | |
| | (9) හබරාදුව | |
| මාතර ... ... | (1) මාතර | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, මාතර |
| | (2) වැලිගම | |
| | (3) කඹුරුපිටිය | |
| | (4) හක්මන | |
| | (5) අකුරැස්ස | |
| | (6) දෙනියාය | |
| | (7) දෙවිනුවර | |
| තංගල්ල ... ... | (1) තිස්සමහාරාමය | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, තංගල්ල |
| | (2) මුල්කිරිගල | |
| | (3) බෙලිඅත්ත | |
| රත්නපුර ... | (1) රත්නපුර | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, රත්නපුර |
| | (2) පැල්මඩුල්ල | |
| | (3) බලංගොඩ | |
| | (4) රක්වාන | |
| | (5) නිවිතිගල | |
| | (6) කලවාන | |
| | (7) කිරිඇල්ල | |
| | (8) කොලොන්න | |
| කෑගල්ල ... ... | (1) කෑගල්ල | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කෑගල්ල |
| | (2) දැදිගම | |
| | (3) ගලිගමුව | |
| | (4) මාවනැල්ල | |
| | (5) යටියන්තොට | |
| | (6) රුවන්වැල්ල | |
| | (7) දෙහිඕවිට | |
| | (8) රඹුක්කන | |

* දිස්ත්‍රික්ක සේවා ක්‍රමය යටතේ බඳවා ගන්නා ගුරුවරුන් ඔවුන්ගේ මුළු ගුරු සේවා කාලයම ඔවුන් පත්කරනු ලබන දිස්ත්‍රික්කය තුළ සේවය කිරීමට නියමිතය.

| අධ්‍යාපන දිස්ත්‍රික්කය | ඡන්දදායක කොට්ඨාශය | අධ්‍යාපන දිස්ත්‍රික්කය භාර නිලධාරියාගේ ලිපිනය |
|---|---|---|
| මහනුවර ... | (1) මහනුවර | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, මහනුවර |
| | (2) වත්තෙගම | |
| | (3) අකුරන | |
| | (4) උඩුනුවර | |
| | (5) ගලගෙදර | |
| | (6) යටිනුවර | |
| | (7) සෙංකඩගල | |
| | (8) කුණ්ඩසාලෙ | |
| | (9) තෙල්දෙනිය | |
| | (10) හේවාහැට | |
| | (11) ගම්පොල | |
| | (12) නාවලපිටිය | |
| | (13) මිනිපේ | |
| | (14) හඟුරන්කෙත | |
| මාතලේ ... ... | (1) මාතලේ | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, මාතලේ |
| | (2) දඹුල්ල | |
| | (3) ලග්ගල | |
| | (4) රත්තොට | |
| නුවරඑළිය ... ... | (1) නුවරඑළිය | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නුවරඑළිය |
| | (2) මස්කෙළිය | |
| | (3) කොත්මලේ | |
| | (4) වලපනේ | |
| | (5) ඌවපරණගම | |
| | (6) වැලිමඩ | |
| බණ්ඩාරවෙල ... | (1) බණ්ඩාරවෙල | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, බණ්ඩාරවෙල |
| | (2) මහියංගනේ | |
| | (3) පස්සර | |
| | (4) බදුල්ල | |
| | (5) සොරනාතොට | |
| | (6) හපුතලේ | |
| මොනරාගල ... ... | (1) මොනරාගල | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, මොනරාගල |
| | (2) බිබිලෙ | |
| හලාවත ... ... | (1) හලාවත | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ... හලාවත |
| | (2) නිකවැරටිය | |
| | (3) බිංගිරිය | |
| | (4) පුත්තලම | |
| | (5) නාත්තන්ඩිය | |
| | (6) වෙන්නප්පුව | |
| කුරුණෑගල ... ... | (1) කුරුණෑගල | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කුරුණෑගල |
| | (2) යාපහුව | |
| | (3) හිරියාල | |
| | (4) වාරියපොල | |
| | (5) කටුගම්පොල | |
| | (6) කුලියාපිටිය | |
| | (7) දඹදෙනිය | |
| | (8) පොල්ගහවෙල | |
| | (9) මාවතගම | |
| | (10) දෙඩම්ගස්ලන්ද | |
| අනුරාධපුරය ... | (1) අනුරාධපුරය | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, අනුරාධපුරය |
| | (2) මැදවච්චිය | |
| | (3) හොරොව්පොතාන | |
| | (4) කැකිරාව | |
| | (5) කලාවැව | |
| | (6) මිහින්තලේ | |
| පොළොන්නරුව ... ... | (1) පොළොන්නරුව | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, පොළොන්නරුව |
| | (2) මින්නේරිය | |
| යාපනය ... ... | (1) යාපනය | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, යාපනය |
| | (2) කයිට්ස් | |
| | (3) උඩුප්පිඩි | |
| | (4) නල්ලූර් | |
| | (5) කන්කසන්තුරේ | |
| | (6) කිලිනොච්චි | |
| | (7) වාවාකච්චේරිය | |
| | (8) පේදුරුතුඩුව | |
| | (9) වඩ්ඩුක් කොඩ්ඩෙයි | |
| | (10) උඩුවිල් | |
| | (11) කෝපායි | |
| වවුනියා ... ... | (1) වවුනියා | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, වවුනියා |
| මන්නාරම ... ... | (1) මන්නාරම | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, මන්නාරම |
| මඩකලපුව ... ... | (1) මඩකලපුව | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, මඩකලපුව. |
| | (2) පදිරුප්පුව | |
| | (3) කල්කුඩා | |
| අම්පාරේ ... ... | (1) අම්පාරේ | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, අම්පාරේ |
| කල්මුනේ ... ... | (1) කල්මුනේ | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, කල්මුනේ |
| | (2) නින්තවූර් | |
| | (3) පොතුවිල් | |

| අධ්‍යාපන දිස්ත්‍රික්කය | ඡන්දදායක කොට්ඨාශය | අධ්‍යාපන දිස්ත්‍රික්කය භාර නිලධාරියාගේ ලිපිනය |
|---|---|---|
| ත්‍රිකුණාමලය ... ... | (1) ත්‍රිකුණාමලය<br>(2) මූත්තූර් | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, ත්‍රිකුණාමලය |

2. උපාධිධාරී ගුරු පුරප්පාඩු පවතින දිස්ත්‍රික්ක පහත සඳහන් වේ :—

| | අධ්‍යාපන දිස්ත්‍රික්කය | | ඡන්ද කොට්ඨාශය |
|---|---|---|---|
| 1. | ගම්පහ | ... | (දොම්පෙ) |
| 2. | ගාල්ල | ... | (බෙන්තර ඇල්පිටිය, බද්දේගම, හිනිදුම) |
| 3. | මාතර | ... | (කඹුරුපිටිය, හක්මන හා දෙනියාය) |
| 4. | තංගල්ල | ... | (සියලුම ඡන්ද කොට්ඨාශ) |
| 5. | රත්නපුර | ... | (පැල්මඩුල්ල, බලංගොඩ, රක්වාන, නිවිතිගල, කලවාන හා කොළොන්න) |
| 6. | කෑගල්ල | ... | (ගලිගමුව, මාවනැල්ල, යටියන්තොට, දෙහිඕවිට, රඹුක්කන හා රුවන්වැල්ල) |
| 7. | මහනුවර | ... | (වත්තේගම, අකුරණ, හඟුරන්කෙත, උඩුනුවර, ගලගෙදර, යටිනුවර, කෙල්දෙණිය, හේවාහැට, ගම්පොළ, නාවලපිටිය හා මිනිපේ) |
| 8. | මාතලේ | ... | (සියළුම ඡන්ද කොට්ඨාශ) |
| 9. | නුවරඑළිය | ... | (සියළුම ඡන්ද කොට්ඨාශ) |
| 10. | බණ්ඩාරවෙල | ... | (සියළුම ඡන්ද කොට්ඨාශ) |
| 11. | මොණරාගල | ... | (සියළුම ඡන්ද කොට්ඨාශ) |
| 12. | හලාවත | ... | (නිකවැරටිය, බිංගිරිය හා පුත්තලම) |
| 13. | කුරුණෑගල | ... | (යාපහුව, හිරියාල, වාරියපොල, දඹදෙණිය හා දොඩංගස්ලන්ද) |
| 14. | අනුරාධපුර | ... | (සියළුම ඡන්ද කොට්ඨාශ) |
| 15. | පොළොන්නරුව | ... | (සියළුම ඡන්ද කොට්ඨාශ) |
| 16. | යාපනය | ... | (කයිට්ස් හා කිලිනොච්චි) |
| 17. | වවුනියා | ... | — |
| 18. | මන්නාරම | ... | — |
| 19. | මඩකලපුව | ... | (පදිරිප්පු) |
| 20. | අම්පාරේ | | — |
| 21. | කල්මුණේ | ... | (පොතුවිල්) |
| 22. | ත්‍රිකුණාමලය | ... | (මුතූර්) |

සුදුසුකම් ඇති අයදුම්කරුවන් සෑම ඡන්ද කොට්ඨාශයකින්ම තෝරාගනු ලැබේ. එහෙත්, පත්වීම් දෙනු ලබන්නේ, පුරප්පාඩු පවත්නා දිස්ත්‍රික්කවල සේවය සඳහා පමණකි. ඉහත නියමිත වශයෙන් සඳහන් කර ඇති පුරප්පාඩු හැරුණ විට, බහුල වශයෙන් සිංහල ජනයා පදිංචි ප්‍රදේශවල දෙමළ මාධ්‍ය ගුරුවරුන් සඳහා ද බහුල වශයෙන් ද්‍රවිඩ ජනයා පදිංචි ප්‍රදේශවල සිංහළ මාධ්‍ය ගුරුවරුන් සඳහා ද පුරප්පාඩු සීමිත සංඛ්‍යාවක් පවතී. පාසැල්වල විශේෂ අවශ්‍යතාවන් සළකා, එම පුරප්පාඩු පුරවනු ඇත.

3. තමා පත්කර තිබෙන දිස්ත්‍රික්කයේ ම සේවය කරන බවටත්, කවර හේතුවක් නිසාවත් දිස්ත්‍රික්කයෙන් බැහැර ස්ථාන මාරුවක් ලබා ගැනීම සඳහා ඉල්ලීම් නොකරන බවටත්, පත්කිරීම සඳහා තෝරා ගනු ලැබූ සෑම අයදුම්කරුවෙකු විසින් ම ගිවිසුමකට ඇතුළත් විය යුතුය. එහෙත්, පත්වීමක් දෙනු ලැබූ අයකු සේවයේ අවශ්‍යතාවන් හෝ පරිපාලනමය වූ වෙනත් හේතූන් මත තාවකාලික වශයෙන් වෙනත් දිස්ත්‍රික්කයකට මාරු කර යැවීමේ අයිතිවාසිකම මෙම අමාත්‍යාංශය සතුවේ.

4. වැටුප් සහ දීමනා :

(I) පළමුවැනි හෝ දෙවැනි පංතියේ ගෞරව උපාධිධරයන් සඳහා (ඒකාබද්ධ වැටුප් ක්‍රමය) රු. 5,736—11/144—6/180—8,400. (කල්පිත වැටුප රු. 3,180—10/120—7/180—5,640)

(II) සෙසු උපාධිධරයන් සඳහා ඒකාබද්ධ වැටුප් ක්‍රමය—රු. 5,160—10/144—7/180—7,860. (කල්පිත වැටුප රු. 2,700—10/120—7/180—5,160)

විවාහ දීමනාව නියමිත ප්‍රමාණයන්ට අනුව ගෙවනු ලැබේ.

5. අවශ්‍ය සුදුසුකම් :

සෑම අයදුම්කරුවෙකුම—

(අ) 1970 අගෝස්තු 21 දිනට තම වයස අවුරුදු 22 ට අඩු හෝ අවුරුදු 45 ට වැඩි හෝ නොවන බවට ද ;

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියෙකු බවටද, උපාධිය සඳහා ගෙන ඇති විෂයයන් සිංහල/දෙමළ මාධ්‍යයෙන් අ.පො.ස. උසස් පෙළ පංතිවලට ඉගැන්වීමේ ප්‍රවීණතාවක් ඇති බවටද, අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී හෝ උසස් විභාගයකදී සිංහල/දෙමළ භාෂාවෙන් සාමාර්ථය ලබා ඇති බවට ද ;

(ඉ) විශිෂ්ට චරිත ශුද්ධියකින් යුක්ත බවට ද ;

(ඊ) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති බවට හා එසේ කිරීමට සුදුසු ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත බවට ද ;

(උ) ලංකාවේ පුරවැසියෙකු බවට ද ;

සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(ඌ) ඔහු/ඇ අයිති ඡන්ද කොට්ඨාශයේ නිත්‍ය පදිංචිකරුවෙකු බව. මෙය, පහත සඳහන් එක් කොන්දේසියක් යටතේ සනාථ කළ යුතුය.—

(I) අදාළ ඡන්ද කොට්ඨාශය තුළ ඉපදී ඇති බවට, උප්පැන්න සහතිකයක් ඉදිරිපත් කිරීම ;

(II) ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට කලින් අවුරුදු 5 ඇතුළත, මාස 36 ක් අඛණ්ඩව අදාළ ඡන්ද කොට්ඨාශය තුළ පදිංචිව සිටි බව ඔප්පු කිරීමට ගෘහ මූලික ලැයිස්තු ඉදිරිපත් කිරීම ;

(III) අදාළ ඡන්ද කොට්ඨාශය තුළ ලියාපදිංචි වී ඇති ඡන්දදායකයකු බව ඔප්පු කිරීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කිරීම.

සටහන.—පහත සඳහන් වර්ගවලට අයත් උපාධිධාරීන් ගැන විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ :—

(I) පළමුවැනි හෝ දෙවැනි පංතියේ ගෞරව උපාධිධාරීන් ;

(II) උපාධි විභාගයේදී විද්‍යා හෝ ගණිත විෂයයක් සහිතව සාමාර්ථයක් ලත් උපාධිධාරීන් ;

(III) උපාධි විභාගයේදී ඉංග්‍රීසි විෂයය සහිතව සාමාර්ථය ලත් උපාධිධාරීන් ;

(IV) අධ්‍යාපන වේදි උපාධිය ලබා ඇති උපාධිධාරීන් ;

(V) අන්තර් මධ්‍යම/කලා යෝග්‍යතා/විද්‍යා යෝග්‍යතා විභාගයේ දී යටත් පිරිසෙයින් පහත සඳහන් විෂයයන් එකකින් වත් සාමාර්ථය ලබා ඇති උපාධිධාරීන්—

(අ) භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ව විද්‍යාව ;

(ආ) ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය ;

(ඉ) ඉංග්‍රීසි.

(VI) භූගෝල විද්‍යාව සහ ආර්ථික විද්‍යාව යන විෂයයන් දෙකින්ම සාමාර්ථය ලබා ඇති උපාධිධාරීන් ;

(VII) පහත සඳහන් විෂයයන් කීපයක් ගෙන, සාමාර්ථය ලබා ඇති උපාධිධාරීන්—

භූගෝල විද්‍යාව, ඉතිහාසය, ආර්ථික විද්‍යාව, ආණ්ඩුක්‍රම හෝ දේශපාලන විද්‍යාව, සිංහල/දෙමළ, පාලි, සංස්කෘත අරාබි යන භාෂා

6. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :

(i) මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය ;

(ii) පත් කරනු ලබන පි‍්‍ර‍ෙ‍ී අපේක්ෂකයන් විසින් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය ;

(iii) ආධුනික කාල සීමාව අවුරුදු තුනකි ;

(iv) පත්වීම ලබන්නා විසින් රජයේ භාෂා ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම සඳහා ද විශේෂයෙන් ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතෙහි විධි විධානයන් ක්‍රියාවේ යෙදවීම සඳහා ද සම්පාදිත ව පවත්නා හෝ මින් මතු සම්පාදනය කෙරෙන යම් යම් ව්‍යවස්ථාවන්ට අනුකූල ව ක්‍රියා කළ යුතුය ;

(v) මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, පරිපාලන රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හා රෙගුලාසි යන මේවාට සහ රජය විසින් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේය ;

(vi) ඉහත iii යටතේ සඳහන් කරන ලද ආධුනික කාල සීමාව තුළ පහත සඳහන් කොන්දේසි මත සේවය කළ යුතුය—

(අ) ප්‍රථම දෙවර්ෂය තුළ ආධුනිකයා විසින් විදුහල්පතිවරුන් දෙදෙනෙකු යටතේ සේවය කළ යුතුය ;

(ආ) ආධුනික ගුරුවරයා සම්බන්ධයෙන්, විදුහල්පතිවරුන්ගේ වාර්තා හා සාමාන්‍ය ඇගයීමේ වාර්තාද සතුටුදායක නම් හා ප්‍රථම දෙවර්ෂය අවසානයේ දී පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයෙන් ආධුනිකයා සාමාර්ථය ලබා ඇත්නම්, ඔහු ගේ/ඇගේ පත්වීම තුන් වර්ෂය අවසානයේ දී ස්ථිර කරනු ලැබේ.

7. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ ඉල්ලුම්පත්‍ර වලට පහත සඳහන් ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකයේ පිටපත ;

(ආ) උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකයේ හා සිංහල/දෙමළ භාෂාවෙන් සමත් උසස්ම විභාග සහතිකයේ පිටපත ;

(ඉ) මෑතදී ලබාගත් චරිත සහතික දෙකක පිටපත්. මින් එකක් තම ප්‍රදේශයේ ග්‍රාම සේවක නිලධාරියාගෙන් ලබාගෙන තම ප්‍රදේශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරියා ලවා සහතික කරවා ගත යුතුයි.

සටහන 1.—ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුත්තේ සහතික පත්‍රවල පිටපත් මිස මුල් පිටපත් නොවේ.

සටහන 2.—ඉහත සඳහන් ලියවිලිවල පිටපත් අමුණා එවීමට අපොහොසත් වන අයදුම් කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ

සටහන 3.—ඉහත සඳහන් ලියවිලිවල මුල් පිටපත් පත්වීම් දෙන අවස්ථාවේදී ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි විට එසේ කළ යුතුය.

8. ඉල්ලුම් පත්‍ර හා ඒ පිළිබඳ වෙනත් ලියකියවිලි මෙම නිවේදනයේ I වැනි ඡේදයේ පරිදි එවිය යුතු අතර, මෙම අමාත්‍යාංශයේ හෝ දෙපාර්තමේන්තු මූල නිලධාරියෙකු නමට පෞද්ගලිකව නොඑවිය යුතුයි.

9. මෙම ගැසට් පත්‍රයේ පළවෙනි කොටසේ දෙවැනි ඡේදයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වෙත අවධානය යොමු කරනු ලැබේ.

10. ඉල්ලුම් පත්‍ර භාරගැනීමේ අවසාන දිනයට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර පිළිගනු නොලැබේ.

11. තැපැල්දී සිදුවිය හැකි ප්‍රමාදයන් මගහැරවීම සඳහා සිය ඉල්ලුම් පත්‍ර කල්වේලා ඇතිව ලේඛනගත තැපැලෙන් එවන ලෙස අයදුම්කරුවන් වෙත දන්වා සිටිනු ලැබේ.

ප්‍රේමදාස උඩගම,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් හා අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

අධ්‍යාපන අමාත්‍යාංශය, මැලේ වීදිය,
කොළඹ 2.
1970 ජුලි මස 30 වැනි දින.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

### දිස්ත්‍රික්ක සේවා ක්‍රමය යටතේ උපාධිධාරී උපගුරු තනතුරු සඳහා අයදුම් පත්‍රය

1. සම්පූර්ණ නම (මුලට පෙළපත් නාමය සමඟ—පැහැදිලි අකුරෙන්) :————.
2. ගෙදර ලිපිනය :————.
3. ඡන්දදායක කොට්ඨාශය :————.
4. අයදුම්කරු අ.පො.ස. (උ.පෙ.) විභාගයට පෙනීසිටි පාසල :————.
5. උපන් දිනය හා ස්ථානය :————.
6. 1970.8.21 වැනි දිනට වයස :————.
7. ස්ත්‍රී පුරුෂ භාවය :————.
8. විවාහකද, අවිවාහකද, යන බව :————.
9. අයදුම්කරුගේ පියා උපන් ස්ථානය :————.
10. අයදුම්කරුගේ මව උපන් ස්ථානය :————.
11. (අ) ජාතිය :————.
    (ආ) ලාංකිකයෙකු වූයේ පරම්පරාවෙන්ද, ලියාපදිංචි කිරීමෙන්ද, යන වග :————.
12. සුදුසුකම් :—
    උපාධිය පිළිබඳ විස්තර—
    (අ) ගෞරව හෝ සාමාන්‍ය :————.
    (ආ) පංතිය :———.
    (ඉ) විශ්ව විද්‍යාලය :————.
    (ඊ) උපාධිය ලැබූ වර්ෂය :————.
    (උ) උපාධිය සඳහා ගත් විෂයයන් :————.

(ඌ) අන්තර් මධ්‍ය/කලා යෝග්‍යතා/විද්‍යායෝග්‍යතා විභාගය සඳහා ගත් විෂයයන් :————.

(එ) භාෂා මාධ්‍යය :————.

13. සිංහල/දෙමළ භාෂාවෙන් ලබා ගත් උපරිම සුදුසුකම් :————.

14. විශේෂ අයිතිවාසිකම්, සුදුසුකම් හෝ පළපුරුදුකම් පිළිබඳ විස්තර :————.

15. තමා බඳවා ගනු ලැබීමට කැමති දිස්ත්‍රික්ක පහක් කැමැත්තේ අනුපිළිවෙළට සඳහන් කරන්න :—

(1) :————.

(2) :————.

(3) :————.

(4) :————.

(5) :————.

16. කලින් යම් සේවයක යෙදී සිටියේ නම් ඒ ගැන විස්තර :————.

මෙම අයදුම් පතෙහි මවිසින් සපයා ඇති කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. තවද, මෙහි අන්තර්ගත කරුණු අසත්‍ය බවට හෝ වැරදි බවට මා තෝරා ගැනීමට කලින් හෙළි වුවහොත් මා නුසුදුස්සකු කිරීමට හැකි බවත්, පත් කරනු ලැබුවායින් පසු සොයා ගතහොත් කිසිදු වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කර දැමිය හැකි බවත්, මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8-209—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### වැඩපොළ කාර්මික තනතුරු

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වැඩපළ කාර්මික තනතුරු සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. මෙහි මතු දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කළ අයදුම් පත් 1970 අගෝස්තු 30 දින හෝ ඊට පෙර හෝ එවිය යුතුය.

2. වැටුප් ක්‍රමය.—මෙම තනතුරට වර්ෂයකට රුපියල් 1,152—144—රු. 6,456 ඒකාබද්ධ වැටුපක් හිමිවේ.

3. සේවයෙහි නියුක්ත කරවීමේ කොන්දේසි.—තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අර මුදලට දායක මුදල් අයකරනු ලැබේ.

4. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.—සෑම අයදුම්කරුවෙකු විසින්ම—

(i) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්, හෝ

(ආ) දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ සහ ගණිතය/අංක ගණිතය ඇතුළු විෂයයන් හයක් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගය,

සහ

(ii) (අ) පිළිගත් කාර්මික ආයතනයක විදුලි හෝ යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය පිළිබඳ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ සහතිකය,

හෝ

(ආ) (i) පිළිගත් වැඩපළක අවුරුදු පහක වෘත්තීය ආධුනිකත්වය.

(ii) පුහුණු ශ්‍රේණියක දෑවුරුදු පළපුරුද්ද.

සටහන.—යටත් පිරිසෙයින් කණිෂ්ඨ පාඨශාලා සහතික තත්ත්වයේ නොහොත් ඒ හා සම තත්ත්වයේ අධ්‍යාපන සුදුසුකම් ලබා ඉහත 4 (ii) ඡේදයේ දක්වෙන කාර්මික සුදුසුකම් ලබා ඇත්තාවූ ද සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අවුරුදු 5 කට නො අඩු අඛණ්ඩ සතුටුදායක සේවයක් ඇති නිලධාරීහුද අයදුම් පත් එවීමට සුදුස්සෝ වෙති.

5. වයස් සීමාව.—අයදුම්කරුවන් 1970.8.30 දිනට අවුරුදු 22 ට නො අඩු විය යුතු අතර අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

සටහන.—දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් කෙරෙහි වයස් සීමාව බලපානු නොලැබේ.

6. මතු සඳහන් ලියකියවිලි කිසිවක් හෝ සියල්ලම ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ විට අපේක්ෂකයන් විසින් ඒවා ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්න ලියාපදිංචි කිරීමේ සහතිකය (සැ.යු.—බව්තීස්ම සහතිකය හෝ උපකෘත පාසල්වල ජීතිමාලාව යටතේ කාර්ය යන් සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතිකය හෝ මේ සඳහා පිළිගනු නොලැබේ.)

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඉ) චරිත සහතික දෙකක් (මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ විද්‍යාලයේ ශික්ෂකගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.)

(ඊ) වෘත්තීය සහ/නොහොත් කාර්මික සුදුසුකම් දක්වෙන සහතිකය.

සටහන.—(i) ලියකියවිලි හෝ ඒවායේ පිටපත් හෝ කිසිත් අයදුම් පත් සමග අමුණා නො එවිය යුතුය.

(ii) ලියකියවිලි ඉදිරිපත් කිරීමට නියම කරනු ලැබූ කල එය කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අයදුම් පත් සලකා බලනු නොලැබේ.

7. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් වන අතර ඒවා සලකා බලනු ලබන්නේ තනතුරු සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරුවලින් මුදවා හරින බවට දෙපාර්තමේන්තු ප්‍රධානීන් එකඟ වුවහොත් පමණකි.

8. අයදුම් පත් සහ ඊට සම්බන්ධ වෙනත් ලියකියවිලි එවිය යුත්තේ කොළඹ, තැ. පෙ. 500 හිමි, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ අමතා මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

9. මෙම ගැසට් පත්‍රයේ I වන කොටස (II) වන ඡේදය ආරම්භයේ පළ කෙරෙන රජයේ සේවයේ තනතුරුවලට කෙරෙන පත්වීම්වලට බලපාන්නාවූ පොදු කොන්දේසිද බලනු මැනවි.

ඩී. ඊ. එම්. සිරිවර්ධන,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1970 ජූලි මස 29 වන දින,
කොළඹ 1, තැ. පෙ. 500 දරන,
ගාලුමුවදොර මහාලේකම් පායේ,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේදී ය.

### අයදුම්පත් ආකෘතිය

#### වැඩපොළ කාර්මික තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————

(i) පෙළපත් නම :————.

(ii) අනෙක් නම් :————.

2. ලිපිනය (ලිපිනයේ වෙනසක් සිදුවුවහොත් වහාම දැනුම් දිය යුතුය) :————.

3. උපන් දිනය :————.

4. 1970 අගෝස්තු 30 දිනයට වයස : අවුරුදු :——, මාස :——, දින :——.

5. පියාගේ/භාරකරුගේ නම හා ලිපිනය :————.

6. පුරවැසි භාවය (පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන්ද) :————.

7. පහත සඳහන් අයගේ උපන් ස්ථාන :—
   (i) ඉල්ලුම්කරුගේ :————.
   (ii) ඉල්ලුම්කරුගේ පියාගේ :————.
   (iii) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.
   (iv) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තා :————.

8. ස්ත්‍රී පුරුෂ භාවය :————.

9. විවාහකද අවිවාහකද :————.

10. අධ්‍යාපනික සුදුසුකම් :————.

11. කාර්මික සුදුසුකම් :————.

12. පාසලෙන්/විද්‍යාලයෙන් අස් වූ දින සිට කරන ලද රැකියාව පිළිබඳ විස්තර :————.

13. විශේෂ සුදුසුකම් :————.

දැන්වීමේ 4 වන ඡේදයෙන් ඉල්ලා ඇති විශේෂ සුදුසුකම් සහ/නොහොත් පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම් දින වකවානු සමග සම්පූර්ණ විස්තර දක්වන්න :————.

14. ඔබ සෞඛ්‍ය දෙපාර්තමේන්තු සේවකයෙක්ද ? (එසේ නම් ඒ පිළිබඳ විස්තර) :————.

මෙම අයදුම් පතේ ම විසින් සපයන්නට යෙදුන තොරතුරු සැබෑ බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් බොරු බව හෝ වැරදි බව හෝ දැන ගන්නට ලැබුණොත් තෝරා ගැනීමට පෙර නම්, එයින් මා නුසුදුස්සකු කරනු ලැබිය හැකි බවත් පත් කිරීමෙන් පසුව නම් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමටත් මා යටත් බවත් මම දනිමි.

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8–164—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

## මුල්ගම්පල උප තැපැල් කාර්යාලයේ උප තැපැල් ස්ථානාධිපති පුරප්පාඩුව "ඒ" ශ්‍රේණිය

මහනුවර නගර සීමාව තුළ පිහිටි මුල්ගම්පල උප තැපැල් කාර්යාලයට උප තැපැල් ස්ථානාධිපතිවරයෙකුගේ තනතුරක් සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. අවම මාසික දීමනාව රු. 75.

1. 1970 සැප්තැම්බර් මස 9 දිනට වයස අවුරුදු 21 ට වැඩි සහ අවුරුදු 45 ට අඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් භාරගනු ලැබේ. අයදුම්කරුවන් ලාංකිකයන් විය යුතුයි.

2. ඉල්ලුම්කරුවන් අවුරුදු 10 ක් හෝ ඊට වැඩි කාලයක සිට නගර සභා ප්‍රදේශයතුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතුයි. උප තැපැල් කාර්යාලය පිහිටි නගරසභා කොට්ඨාශයතුල සහ යාබද කොට්ඨාශවල පදිංචිකරුවන් ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

3. ඉල්ලුම්කරුවන් සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/මූලික ගණිතය ඇතුළුව අඩු වශයෙන් විෂයයන් තුනකින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික විභාගය/අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය විභාගය සමර්ථව තිබිය යුතුයි.

4. මුල්ගම්පල දැනට ඇති උප තැපැල් කාර්යාලය අවට උප තැපැල් කාර්යාලය පවත්වා යාමට ගොඩනැගිල්ලක් අයදුම්කරු විසින් සපයා ගත යුතුයි.

5. අයදුම්පත් පෝර්ම මහනුවර ප්‍රාදේශීය තැපැල් අධිකාරීගෙන් 1970.9.9 දින දක්වා පැමිණ හෝ තැපැලෙන් ලබාගත හැකිය. අයදුම් පත් සම්පූර්ණකර 1970.9.9 දිනට හෝ ඊට පෙර ප්‍රාදේශීය තැපැල් අධිකාරී (මධ්‍යම) මහනුවර යන ලිපිනයට එවිය යුතුයි.

තවදුරටත් විස්තර අවශ්‍යනම් මහනුවර ප්‍රාදේශීය තැපැල් අධිකාරී තැනගෙන් ලබාගත හැක.

වර්නන් ඇම්. අබේසේකර,
පෝස්ට් මාස්ටර් ජනරාල් සහ විදුලි සංදේශ අධ්‍යක්ෂක තැන.

8–203—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

## පොළොන්නරුව දිස්ත්‍රික්කයේ එගොඩ පත්තු උතුර කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ තමන්කඩුව පළාත කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය සහ උඩරට) රෙජිස්ට්‍රාර් ධුරය

එගොඩ පත්තු උතුර උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතු කොට ගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිඑකට නො නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ සේවයෙහි නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අතිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියලු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාමසේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජාමණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොළවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශණය කරඇති දැන්වීම්වල ඇතුලත් වේ.

3. මෙම ධුරය සඳහා දෙමළ භාෂාව දන්නා සිංහල බසින් වැඩ කළ හැකි අයදුම්කරුවන් කෙරෙහි විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

4. සියළුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1970 සැප්තැම්බර් 14 වෙනි දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය.

ක. බ. සූරියගොඩ,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1970 ජූලි මස 23 වෙනි දින,
පොළොන්නරුවේ,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දීය.

8–44—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

## පොළොන්නරුව දිස්ත්‍රික්කයේ එගොඩ පත්තුව දකුණ කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ තමන්කඩුව පළාත කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය හා උඩරට) රෙජිස්ට්‍රාර් ධුරය

එගොඩ පත්තුව දකුණ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතු කොට ගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු විසි එකට (21) නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ සේවයෙහි නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුළත් වේ.

3. සියලුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1970 සැප්තැම්බර් මස 14 වෙනි දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

ක. බ. සූරියගොඩ,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1970 ජූලි මස 23 වෙනි දින,
පොළොන්නරුව,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දීය.

8–45—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

## ලංකා ගුවන් විදුලි සංස්ථාව

### සහන නිවේදක (සිංහල) තනතුරු—වෙළඳ සේවය

ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සහන නිවේදක (සිංහල) තනතුරු සඳහා ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් අනියම් පදනමක් මත සේවයට බඳවාගනු ලබන අතර, දිනකට රු. 24 ක උපරිම සීමාවට යටත්ව පැයකට රු. 3 බැගින් ගෙවනු ලැබේ. ගමන් ගාස්තු හෝ වෙනත් දීමනා කිසිත් ගෙවනු නොලැබේ.

2. අයදුම්කරුවන් කෙටි කාලීන පුහුණුවක් ලැබිය යුතුයි. එම පුහුණුවීම වෙනුවෙන් කිසිදු ගෙවීමක් කරනු නොලැබේ.

3. සහන නිවේදකයින් වශයෙන් සේවාව සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් මෙම ආයතනයේ ස්ථිර සේවකයන් නොවන අතර, අවශ්‍ය වන විටදී පමණක් ඔවුන් සේවාවට කැඳවනු ලැබේ.

4. අයදුම්කරුවන් වයස අවුරුදු 18 ට වැඩි විය යුතු අතර, ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් හෝ සමත් වූ අය විය යුතුයි. සිංහල පිළිබඳ විශේෂ දැනුමක් අවශ්‍ය වේ. ඉංග්‍රීසි පිළිබඳ සාමාන්‍ය දැනීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ. ඉල්ලුම්කරුවන් ටොරිංටන් චතුරශ්‍රයේ පිහිටා ඇති ලංකා ගුවන් විදුලි සංස්ථා කාර්යාලයේ සිට සැතපුම් 5 ක සීමාව ඇතුළත වාසය කරන්නන් විය යුතුයි. ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සේවය කරන යථෝක්ත සුදුසුකම් ඇති නිලධාරීන්ටද මෙම තනතුර සඳහා ඉල්ලුම් කළ හැකිය.

5. මෙම දැන්වීම අග ඇති නිදර්ශන ආකෘති අනුව සැපයිය යුතු අයදුම්පත් 1970 අගෝස්තු මස 22 වෙනි දිනට පෙර ලැබෙන සේ කොළඹ 7, ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුයි. අයදුම්පත් සපයනු නොලැබේ. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවර "සහන නිවේදක තනතුර (සිංහල)" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුයි.

6. ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ.

සුසිල් මුණසිංහ,
අධ්‍යක්ෂ ජනරාල්,
ලංකා ගුවන් විදුලි සංස්ථාව.

1970 ජූලි මස 24 වැනි දින,
කොළඹ 7.

### නිදර්ශන ආකෘති පත්‍රය

#### සහන නිවේදක (සිංහල) තනතුර

(1) සම්පූර්ණ නම :————.

(2) ස්ථිර ලිපිනය :————.

(3) උපන් දිනය සහ ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි).

(4) 1970 අගෝස්තු මස 22 වැනි දිනට වයස : අවුරුදු :——, මාස :——, දින :——.

(5) ජාතිය :————.

(6) අධ්‍යාපනික සුදුසුකම් :————.
(සහතික පිටපතක් ඇමිණිය යුතුයි).

(7) භාෂා පිළිබඳ ප්‍රවීණතාව :—
(අ) සිංහල :————.
(ආ) ඉංග්‍රීසි :————.
(ඇ) වෙනත් භාෂා :————.

(8) ගුවන් විදුලි ප්‍රචාරක කටයුතු පිළිබඳ පළපුරුද්ද හා වෙනත් විශේෂ හිමිකම් පිළිබඳ විස්තර :————.

(9) සහතික පත් ලබාගත් අයගේ නම් හා ලිපින :————.
(සහතික පිටපත් ඇමිණිය යුතුයි).

(10) දැනට යෙදී සිටින හා කලින් යෙදුණ රැකියාවල් පිළිබඳ විස්තර දින සහිතව :————.

දිනය :————. අත්සන :————.

8-140/1—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

## ලංකා ගුවන් විදුලි සංස්ථාව

### සහන නිවේදක (හින්දි) තනතුරු—වෙළඳ සේවය

ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සහන නිවේදක (හින්දි) තනතුරු සඳහා ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් අනියම් පදනමක් මත සේවයට බඳවා ගනු ලබන අතර, දිනකට රු. 24 ක උපරිම සීමාවට යටත්ව පැයකට රු. 3 බැගින් ගෙවනු ලැබේ. ගමන් ගාස්තු හෝ වෙනත් දීමනා කිසිත් ගෙවනු නොලැබේ.

2. අයදුම්කරුවන් කෙටිකාලීන පුහුණුවක් ලැබිය යුතුයි. එම පුහුණුවීම වෙනුවෙන් කිසිදු ගෙවීමක් කරනු නොලැබේ.

3. සහන නිවේදකයින් වශයෙන් සේවාව සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් මෙම ආයතනයේ ස්ථිර සේවකයන් නොවන අතර, අවශ්‍ය වන විටදී පමණක් ඔවුන් සේවාවට කැඳවනු ලැබේ.

4. අයදුම්කරුවන් වයස අවුරුදු 18 ට වැඩි විය යුතු අතර, ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් හෝ සමත්වූ අය විය යුතුයි. හින්දි පිළිබඳ විශේෂ දැනුමක් අවශ්‍ය වේ. ඉංග්‍රීසි පිළිබඳ සාමාන්‍ය දැනීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ. ඉල්ලුම්කරුවන් ටොරිංටන් චතුරශ්‍රයේ පිහිටා ඇති ලංකා ගුවන් විදුලි සංස්ථා කාර්යාලයේ සිට සැතපුම් 5 ක සීමාව ඇතුළත වාසය කරන්නන් විය යුතුයි. ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සේවය කරන යථෝක්ත සුදුසුකම් ඇති නිලධාරීන්ටද මෙම තනතුර සඳහා ඉල්ලුම් කළ හැකිය.

5. මෙම දැන්වීම අග ඇති නිදර්ශන ආකෘති අනුව සැපයිය යුතු අයදුම්පත් 1970 අගෝස්තු මස 22 වැනි දිනට පෙර ලැබෙන සේ කොළඹ 7, ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුයි. අයදුම්පත් සපයනු නොලැබේ. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවර "සහන නිවේදක තනතුර (හින්දි)" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුයි.

6. ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ.

සුසිල් මුණසිංහ,
අධ්‍යක්ෂ ජනරාල්,
ලංකා ගුවන් විදුලි සංස්ථාව.

1970 ජූලි මස 24 වැනි දින,
කොළඹ 7.

### නිදර්ශන ආකෘති පත්‍රය

#### සහන නිවේදක (හින්දි) තනතුර

1. සම්පූර්ණ නම :————.
2. ස්ථිර ලිපිනය :————.
3. උපන් දිනය සහ ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.)
4. 1970 අගෝස්තු මස 22 වැනි දිනට වයස : අවු :——, මාස :——, දින :——.
5. ජාතිය :————.
6. අධ්‍යාපනික සුදුසුකම් :————.
(සහතික පිටපත් ඇමිණිය යුතුයි.)
7. භාෂා පිළිබඳ ප්‍රවීණතාව :—
(අ) හින්දි :————.
(ආ) සිංහල :————.
(ඇ) වෙනත් භාෂා :————.
8. ගුවන් විදුලි ප්‍රචාරක කටයුතු පිළිබඳ පළපුරුද්ද හා වෙනත් විශේෂ හිමිකම් පිළිබඳ විස්තර :————.
9. සහතික පත් ලබාගත් අයගේ නම් හා ලිපින :————.
(සහතික පිටපත් ඇමිණිය යුතුයි.)
10. දැනට යෙදී සිටින හා කලින් යෙදුණු රැකියාවල් පිළිබඳ විස්තර දින සහිතව :————.

අත්සන :————.

දිනය :————.

8-140/2—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

## මැනුම් දෙපාර්තමේන්තුව

### ප්‍රවාහන නිලධාරි තනතුර

අංක, 14,914 හා 1970 ජූලි 10 දිනැති ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ පළකර තිබූ මැනුම් දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත් කැඳ වූ නිවේදනය කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ. මෙම තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනය 70.8.22 දින දක්වා දීර්ග කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සී. පී. ගුණවර්ධන,
සර්වේ ජනරාල්.

1970. 7. 28 දින,
කොළඹ 5, සර්වේ ජනරාල් කාර්යාලයේ,
ආයතන අංශයේදීය.

8-88—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

## රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

### ඇබෑර්තු

සංස්ථාවේ පහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් ඇති ලාංකිකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**ගණකාධිකාරි තනතුර**

**වැටුප් පරිමාණය.**—රු. 1,350—6×50—1,650 මසකට (සියළු දීමනා ඇතුළුව).

**2. වයස් සීමාව.**—1970.8.21 දිනට අවුරුදු 30ටත් 40ටත් අතර විය යුතුයි. රජයේ හෝ සංස්ථාවක සේවය කරනු ලබන අය මේනු වෙන් උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

**3. අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම්.**—(1) අවම වශයෙන් වසර තුනක පළපුරුද්ද සමඟ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ සංස්ථා බලයලත් ගණකාධිකාරී ආයතනයේ හෝ පිළිවැය ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයකු වීම හෝ අවම වශයෙන් වසර පහක පළපුරුද්දක් සමඟ මෙම ආයතනයන්හි මධ්‍ය පරීක්ෂණයෙන් සමත් වී තිබීම;

හෝ

(2) අවම වශයෙන් වසර පහක පළපුරුද්ද සමඟ අවසාන ගණක පරීක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම හෝ අවම වශයෙන් වර්ෂ හතක් රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක හෝ සහකාර ගණකාධිකාරීවරයකු වශයෙන් සේවය කර තිබීම.

තෝරාගනු ලැබූ අයදුම්කරුගේ පළපුරුද්ද හා සුදුසුකම් අනුව ඉහත සඳහන් වැටුප් පරිමාණයේ සුදුසු පියවරක් මත තබනු ඇත.

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ සභාපතිගෙන් ලබාගන්නා ආකෘති පත්‍රවල පිළියෙල කෙරුණු අයදුම්පත් කොළඹ 5, 2 බී, ද ෆොන්සේකා පාරේ රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ සභාපති වෙත 1970.8.21 දිනට හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

අයදුම්පත් අඩංගු ලියුම් කවරවල වම් පස උඩ කෙළවර අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර එවිය යුතුයි.

සාමාන්‍ය කාර්යාල වේලාවන්හිදී මෙම කාර්යාලයෙන් පෞද්ගලිකවද ලිපිනය සහිත මුද්දර ගැසූ 9"×4" ප්‍රමාණයේ කවරයක් සභාපති වෙත එවීමෙන්ද අයදුම්පත් ලබාගත හැක.

අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

සභාපති,
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

2 බී, ද ෆොන්සේකා පාර,
කොළඹ 5,
1970.7.21.

8–185—70:8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

අංකය : එස්. එච්. 290/70

## පොලිස් දෙපාර්තමේන්තුව

### පොලිස් කොස්තාපල්වරුන්ගේ තනතුරු

ලංකා පොලිස් සේවයේ කොස්තාපල්වරුන් වශයෙන්, පුහුණුව ලැබීම සඳහා මතු දැක්වෙන සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

2. මෙයට යාකොට ඇති ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම් පත් කොළඹ කොටුවේ ඇවිලන් චතුරශ්‍රයේ පිහිටා ඇති පොලිස් අභ්‍යාස විද්‍යාලයේ අධ්‍යක්ෂක වෙත ලිපිනය කර, 1970.9.7 දින හෝ ඊට පෙර ලැබෙන ලෙස එවිය යුතුය. අයදුම් පත් එවන කවරයේ "ආධුනික පොලිස් කොස්තාපල් අයදුම් පත" යන්න සඳහන් කළ යුතුයි. අභ්‍යාස විද්‍යාලයෙන් ඉල්ලුම් පත් නිකුත් කරනු නොලැබේ.

**3. වැටුප් ක්‍රමය.**—පළමුවැනි අවුරුද්ද වර්ෂයකට රු. 2,640, ඉන්පසු වර්ෂයකට 2,760—22×60—රු. 4,080. රු. 3,060, රු. 3,360, රු. 3,600 සහ රු. 3,900 යන පියවරයන්ට පෙර කාර්යක්ෂමතා කඩඉම් සහිතව.

**4. අපේක්ෂකයින් සතුව තිබිය යුතු සුදුසුකම්.**—

(අ) **වයස් සීමාව**—1970.9.7 වැනි දිනට වයස අවුරුදු 18 ත් ඉහළ සහ අවුරුදු 25 ත් පහළ විය යුතුයි. සේවා මුක්ත භටයනට සාමාන්‍ය වයස පිළිබඳ අනුග්‍රහය ලැබෙනු ඇත. ලංකාවේ එක්සත් රාජධානි කඳවුරුවල නියුක්තව සිටි සේවකයිනට, අංක 427 සහ 437 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛණයෙන් පැවරෙන සියළුම අනුග්‍රහයන් හිමිවේ.

(ආ) **අධ්‍යාපනික**—අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් අනුමත කරන ලද පාසැලකින් නිකුත් කරන ලද කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය, හෝ එවැනි පාසැලක 8 වැනි පංතියෙන් සාමාර්ථයක් ලැබ එම සාමාර්ථය, කණිෂ්ඨ පාඨශාලා සහතිකයට සමාන යයි එම පාසල් ප්‍රධානියා විසින් සහතික කිරීම හෝ පිරිවෙන් අවසන් පරීක්ෂණයෙන් සාමාර්ථයක් ලැබීම.

(ඇ) **ශාරීරික**—(i) උස අඩි 5, අඟල් 4 (අඩුම)

(ii) පපුව අඟල් 31 යි (නි. ස්වාසයේදී)

(ඈ) **වෙනත් සුදුසුකම්**—අයදුම්කරුවන් අවිවාහකයින් විය යුතුය. සේවාමුක්ත භටයෝද ලංකාවේ එක්සත් රාජධානි කඳවුරුවලින් අස්කරන ලද හමුදාවකට අයත් නොවූ සේවකයෝද මෙම අවශ්‍යතාවයෙන් මුදනු ලැබේ.

(ඉ) තෝරාගනු ලබන අපේක්ෂකයින් පත්වීම ලැබීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි. පොලිස් සේවයෙහි සේවයට නුසුදුසු වන අපේක්ෂකයින් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ඊ) **ඇස් පෙනුම**—පෙනීම එක් ඇසකින් 6/12 අඩු නොවිය යුතුයි. එක් ඇසක පෙනුම 6/6 නම්, අනෙක් ඇසින් 6/18 පෙනුම පිළිගනු ලැබේ. වර්ණ පෙනුම සාමාන්‍ය විය යුතුයි. යම් අපේක්ෂකයෙකු උපැස් පාවිච්චි කරන්නේ නම් ඔහු සේවයට නුසුදුස්සෙකි.

**සැලකිය යුතුයි.**—දිවයිනේ හෝ විදේශයන්හි ක්‍රීඩා තරඟ ආදියට සහභාගී වී විශිෂ්ඨ ජයග්‍රහණයන් ලබා ඇති අයදුම්කරුවන්ගෙන් උසෙහි හෝ පපුවෙහි මිනුම්වල මඳ ඌණතාවයක් ඇති වුවත්, සෙසු අවශ්‍යතාවයන්ට අනුකූල වේ නම් ඔවුන්ගේ අයදුම් පත්ද, පිළිගනු ලැබේ.

**5. පත්වීම් කොන්දේසි.**—තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට සහ පොලිස් අනුග්‍රහ අරමුදල වැනි වෙනත් දෙපාර්තමේන්තු අරමුදල් ආදියට දායක විය යුතුයි.

**6. සේවා කොන්දේසි.**—

(i) පත්වීම් තුන් අවුරුදු ආධුනික කාලයකට යටත් වේ.

(ii) තෝරාගනු ලබන අපේක්ෂකයින්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහාද විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතේ විධි විධානයන් ක්‍රියාවට නැඟීම පිණිස සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කෙරෙන හෝ යම් යම් ව්‍යවස්ථාවන්ට අනුකූල වීම අවශ්‍ය වේ.

(iii) තෝරාගනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය සේවා කොමිෂන් සභා රෙගුලාසි, කාර්ය සංවිධානයෙන් වන රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, පොලිස් විනය නීති සංග්‍රහය සහ පොලිස්පති වරයා විසින් හෝ රජය විසින් විටින් විට නිකුත් කරන නියෝගයන්ට යටත් විය යුතු වේ.

(iv) සෑම අපේක්ෂකයෙකුම පත්වීම ස්ථිර කිරීමට පෙර නියම කරන ලද දෙපාර්තමේන්තු පරීක්ෂණවලින් සමත් විය යුතුයි. දෙපාර්තමේන්තු පරීක්ෂණ වලින් අසමත් වන හෝ පොලිස් රාජකාරිවලට නුසුදුසු යයි පිළිගැනෙන අය සේවයෙන් අස් කිරීමට ඉඩ තිබේ.

(v) ඔවුන්ගේ පත්වීම් ස්ථිර කරන තුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. කෙසේ වෙතත් මේ සඳහා අවුරුදු දෙකක සතුටු දායක සේවයක් ඇති කොස්තාපල්වරුන්ගෙන් ලැබෙන ඉල්ලුම් පත් සලකා බලා, පොලිස්පති වරයාගේ අභිමතය පරිදි අවසර දෙනු ලැබේ.

7. මෙම ගැසට් පත්‍රයෙහි පළමු කොටසේ දෙවැනි ඡේදයේ ආරම්භයේ එන රාජ්‍ය සේවා තනතුරුවලට අදාල පොදු කොන්දේසිවලට අවධානය යොමු කළ යුතුයි.

8. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම් පත්වලට පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(i) උප්පැන්න සහතිකය.

(ii) මෑතකදී ගන්නා ලද චරිත සහතික දෙකක්.

(iii) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

9. අවසාන දිනට පසුව ලැබෙන සහ මෙම ගැසට් නිවේදනයට අනුකූල නොවන ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද, ඒවාට පිළිතුරු සපයනු නොලැබේ.

ඩී. එස්. ඊ. පී. ආර්. සේනානායක,
වැඩ බලන පොලිස්පති.

1970 ජූලි මස 28 වැනි දින,
කොළඹ 1, පොලිස් මූලස්ථානයේ දී ය.

## ආදර්ශ අයදුම් පත්‍රය

### ආධුනික පොලිස් කොස්තාපල් තනතුර

1. සම්පූර්ණ නම (අයදුම්කරුගේ උප්පැන්න සහතිකයේ සඳහන්ව ඇති පරිදිම් විය යුතුයි) :————.
2. පියාගේ සම්පූර්ණ නම :————.
2 පියාගේ රැකියාව :————.
4. අයදුම්කරු උපන් ස්ථානය :————, පළාත :————, උපන් ස්ථානයට කිට්ටු පොලිස් ස්ථානය :————.
5. උස :————, පපුව (හුස්ම නාල්ලා) :————.
6. 1970. 9. 7 දිනට වයස :————, උපන් දිනය :————. (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)
7. (අ) ජාතිය :————.
   (ආ) ඔබ ලාංකිකයෙකු වූයේ පරම්පරාවෙන් ද ? නැතහොත් ලියාපදිංචි වීමෙන් ද ? :————.
   (ලියා පදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)
   (ඇ) ඔබ පරම්පරාවෙන් ලාංකිකයෙකු නම්, උපන් ස්ථානය :—.
      (i) අයදුම්කරු :————.
      (ii) ඔබගේ පියාගේ :————.
      (iii) පිය පක්ෂයේ මුත්තාගේ :————.
      (iv) පිය පක්ෂයේ මී මුත්තාගේ :————.
8. දැනට ලිපිනය :————.
   (එම ලිපිනයට ඉතා කිට්ටු පොලිස් ස්ථානය) :————.
9. (අ) විවාහකද ? :————.
   (ආ) අනියම් බිරිඳක් සිටීද ? :————.
10. දැනට කරන රක්ෂාව :————.
11. යුද්ධ හමුදාවේ සේවය කරන්නෙහිද, නැතහොත් යුද්ධ හමුදාවේ හෝ ලංකාවේ එක්සත් රාජධානි කඳවුරුවල සේවය කළෙහිද ?————.
   (අස් වීමේදී දෙන ලද සහතිකයේ පිටපත් අමුණන්න)
12. අධ්‍යාපනික සුදුසුකම් :————.
   (සමත් වී ඇති උසස්ම විභාගයේ සහතිකවල පිටපත් අමුණන්න)
13. විශේෂ සුදුසුකම් තිබේද ? :————.
14. අයදුම්කරු ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :————.
15. (අ) ඔබ මීට පෙර පොලිස් සේවයට බැඳීමට ඉල්ලුම් කළෙහිද :————, එසේ නම් විස්තර දෙන්න :————.
   (එවන ලද පිළිතුරේ පිටපතක් එවන්න)
   (ආ) ඔබ මීට පෙර පොලිස් සේවයේ සිටියෙහිද ? :————.
16. ඔබ හෝ ඔබගේ කිසියම් ඥාතියෙකු යම්කිසි අපරාධයක් සම්බන්ධයෙන් නඩුවකට පැටලී, උසාවියට කැඳවනු ලැබ, නඩු පවරනු ලැබ හෝ දඬුවම් ලබා හෝ ඇද්ද ? එසේ නම් විස්තර සපයන්න :————.

ඉහත සඳහන් කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය ඒවා බව මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**සැළකිය යුතුයි.**—අයදුම්කරුවන් විසින්ම අවශ්‍ය කරුණු පුරවා ඉල්ලා ඇති සහතික පිටපත් සමග පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි :—

පුහුණු කිරීමේ අධ්‍යක්ෂක,
පොලිස් අභ්‍යාස විද්‍යාලය,
ඇම්ලන් චතුරශ්‍රය,
කොළඹ 1.

8–158—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

අංකය : එස්. එච්. 288/70

## පොලිස් දෙපාර්තමේන්තුව

### ආධුනික උප පොලිස් පරීක්ෂකවරුන් බඳවා ගැනීම

ලංකා පොලිස් සේවයේ ආධුනික උප පොලිස් පරීක්ෂකවරුන්ගේ තනතුරු සඳහා ලාංකිකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. අයදුම්පත් පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව කොළඹ කොටුවේ ඇම්ලන් චතුරශ්‍රයේ පිහිටා ඇති පොලිස් අභ්‍යාස විද්‍යාලයේ අධ්‍යක්ෂක වෙත ලිපිනය කර 1970. 9. 7 වැනි දින හෝ එදිනට පෙර ලැබෙන සේ " ලියාපදිංචි කළ තැපෑලෙන් " එවිය යුතුයි. දෙපාර්තමේන්තුව මගින් අයදුම්පත් නිකුත් නොකරන අතර, අයදුම්පත් සඳහා කරන ඉල්ලීම් ද පිළිගනු නොලැබේ. අයදුම්පත් එවන කවරයෙහි වම් කෙළවරෙහි " ආධුනික උප පොලිස් පරීක්ෂක අයදුම් පත ". යන්න සඳහන් කළ යුතුයි

3. වැටුප් ක්‍රමය :

**උප පරීක්ෂකවරුන්.**—ප්‍රථම වර්ෂය—වර්ෂයකට රු. 4,008 ; දෙවන වර්ෂය—වර්ෂයකට රු. 4,296 ; ඊට පසු වර්ෂයකට රු. 4,584—5×144—රු. 5,304.

**පරීක්ෂකවරුන්.**—වර්ෂයකට රු. 5,592—7×144, 12×180 සහ 1×240—රු. 9,000 (රු. 5,592, රු. 7.320 සහ රු. 8,220 ට පෙර කාර්යක්ෂමතා කඩඉම්) (බඳවා ගනු ලබන්නේ රු. 5,304 වාර්ෂික උපරිම වැටුපට එළඹී සිටින යෝග්‍ය උප පරීක්ෂකයින් උසස් කිරීමෙනි).

**ප්‍රධාන පරීක්ෂකවරු.**—වර්ෂයකට රු. 9,240—3×240—1×360—රු. 10,320 (බඳවා ගනු ලබන්නේ පරීක්ෂක නිලයෙන් තෝරා ගැනීමෙන් වන අතර, එය ජ්‍යෙෂ්ඨතාවය සහ කුශලතාවය මත රඳා පවතී).

4. (i) **වයස් සීමාව.**—1970. 9. 7 වැනි දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 19ටත් 25ටත් අතර විය යුතුයි. සේවා මුක්ත භටයන්ට හා ලංකාවේ එක්සත් රාජධානි කඳවුරුවල නියුක්තව සිටි සේවකයින්ට අංක 427 සහ 434 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛනයන්ගේ සඳහන් වයස පිළිබඳ අනුග්‍රහ හිමි වේ.

(ii) අවශ්‍ය අධ්‍යාපනික සුදුසුකම් ඇති සෙසු සියලුම අවශ්‍යතාවයන් සම්පූර්ණ කළ පොලිස් කොස්තාපල්වරුන්ට සහ සැරයන්වරුන්ටද ඔවුන්ගේ වයස 1970. 9. 7 වැනි දිනට අවුරුදු 30 ට අඩු නම් මේ සඳහා ඉල්ලුම් කළ හැකිය. එවැනි අයදුම්පත් ඒ ඒ පළාත්/දිස්ත්‍රික්ක/කොට්ඨාශ භාර නිලධාරීන් මගින් කොළඹ කොටුවේ ඇම්ලන් චතුරශ්‍රයේ පිහිටා ඇති පොලිස් අභ්‍යාස විද්‍යාලයේ අධ්‍යක්ෂක වෙත ඉදිරිපත් කළ යුතුය.

5. **අධ්‍යාපනික, ශාරීරික හා වෙනත් සුදුසුකම්.**—

(අ) අයදුම්කරුවන් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට උසස් විභාගයකින් හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය ඇතුළුව වාර දෙකකට නොවැඩි ගණනකදී විෂයයන් 6 කින් සාමාර්ථය ලබා සිටිය යුතුයි. ක්‍රීඩා සුදුසුකම් හිමි අයට විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ. සේවා මුක්ත භටයන් හා ලංකාවේ එක්සත් රාජධානි කඳවුරුවල නියුක්තව සිටි සේවකයින් කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සමත් වී ඇත් නම් මේ සඳහා ඉල්ලුම් කිරීමට සුදුස්සෝ වෙති.

(ආ) උස : අඩි 5, අඟල් 6 (අවම) ; පපුව : අඟල් 34 යි (හුස්ම නාල්ලා ; ඇස් පෙනුම : පෙනීම එක් ඇසකින් 6/12 අඩු නොවිය යුතුය. එක් ඇසක පෙනුම 6/6 නම් අනෙක් ඇසෙන් 6/18 පෙනුම පිළිගනු ලැබේ. වර්ණ පෙනුම සාමාන්‍ය විය යුතුයි. යම් අපේක්ෂකයකු උපැස් පාවිච්චි කරන්නේ නම් ඔහු සේවයට නුසුදුස්සෙකි.

**සැළකිය යුතුයි.**—දිවයිනේ හෝ විදේශයන්හි ක්‍රීඩා තරඟ ආදියට සහභාගී වී විශිෂ්ඨ ජයග්‍රහණයක් ලබා ඇති අයදුම්කරුවන්ගේ උසෙහි හෝ පපුවෙහි මිණුම්වල මඳ ඌණතාවයක් ඇති වුවත්, සෙසු අවශ්‍යතාවයන්ට අනුකූල වේ නම් ඔවුන්ගේ අයදුම්පත් ද පිළිගනු ලැබේ.

(ඇ) අයදුම්කරුවන් අවිවාහකයින් විය යුතුයි. සේවා මුක්ත භටයන් හා ලංකාවේ එක්සත් රාජධානි කඳවුරුවලින් මුදා හැරී සේවකයින් ද, පොලිස් අයදුම්කරුවන් ද, අවශ්‍යතාවයෙන් මුදා හරිනු ලැබේ.

(ඈ) තෝරාගත් අපේක්ෂකයින් පත්වීම ලැබීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි. පොලිස් සේවය සඳහා නුසුදුසු යයි තීරණය කරනු ලබන අපේක්ෂකයින් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. **බඳවා ගැනීමේ කොන්දේසි.**—තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු සහ අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදලට සහ පොලිස් අනුග්‍රහ වැනි වෙනත් දෙපාර්තමේන්තු අරමුදල්වලට දායක විය යුතුයි.

7. (i) පත්වීම තුන් අවුරුදු ආධුනික කාලයකට යටත් වේ.

(ii) තෝරාගනු ලබන අපේක්ෂකයින් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද විශේෂයෙන්ම 1956 අංක 33 රාජ්‍ය භාෂා පණතේ විධි විධානයන් ක්‍රියාත්මක කිරීම පිණිස සම්පාදිතව පවත්නා හෝ මින් මතුව සම්පාදනය කෙරෙන හෝ යම් ව්‍යවස්ථාවනට අනුකූල වීම අවශ්‍ය වේ.

(iii) තෝරාගනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය සේවා කොමිෂන් සභා රෙගුලාසි, කායික සංවිධානයෙන් වන රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, පොලිස් විනය නීති සංග්‍රහය සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ විටින් විට නිකුත් කරන නියෝගයන්වලද යටත් විය යුතුයි.

(iv) සෑම අපේක්ෂකයකුම පත්වීම ස්ථිර කිරීමට පෙර නියම කරන ලද දෙපාර්තමේන්තු පරීක්ෂණවලින් සමත් විය යුතුයි. දෙපාර්තමේන්තු පරීක්ෂණවලින් අසමත් වන හෝ පොලිස් රාජකාරිවලට නුසුදුසුයැයි පිළිගැනෙන අය සේවයෙන් අස් කිරීමට ඉඩ තිබේ.

(v) ඔවුන්ගේ පත්වීම ස්ථිර කරන තුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. මේ සඳහා අවුරුදු දෙකක සතුටුදායක සේවයක් ඇති ආධුනික උප පොලිස් පරීක්ෂකවරුන් ගෙන් ලැබෙන අයදුම්පත් සලකා බලා පොලිස්පතිවරයාගේ අභිමතය පරිදි අවසර දෙනු ලැබේ.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ එන රාජ්‍ය සේවා තනතුරුවලට අදාල පොදු කොන්දේසිවලට අවධානය යොමු කළ යුතුයි.

9. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත්වලට පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුයි :—

(i) උප්පැන්න සහතිකය;

(ii) මෑතදී ගන්නා ලද චරිත සහතික දෙකක්;

(iii) අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය.

10. අවසාන දිනට පසුව ලැබෙන සහ මෙම ගැසට් නිවේදනයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද, ඒවාට පිළිතුරු සපයන්නේ නැත.

ඩී. එස්. ඊ. පී.ආර්. සේනානායක,
වැඩ බලන පොලිස්පති.

1970 ජූලි මස 28 වැනි දින,
කොළඹ 1, පොලිස් මූලස්ථානයේදීය.

## ආදර්ශ අයදුම් පත්‍රය

### ආධුනික උප පොලිස් පරීක්ෂක

1. සම්පූර්ණ නම (අයදුම්කරුගේ උප්පැන්න සහතිකයේ සඳහන්ව ඇති පරිදිම විය යුතුයි.) :————.

2. පියාගේ සම්පූර්ණ නම :————.

3. පියාගේ රැකියාව :————.

4. අයදුම්කරුගේ උපන් ස්ථානය :————.
පළාත :————.
උපන් ස්ථානයට කිට්ටු පොලිස් ස්ථානය :————.

5. උස :————, පළුව (හුස්ම නාල්ලා) :————.

6. 1970.9.7 දිනට වයස :————.
උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.)

7. (අ) ජාතිය :————.
(ආ) ඔබ පරම්පරාවෙන් ලාංකිකයෙකු නම් උපන් ස්ථානය : ————.
පදිංචිවීමෙන්ද? (ලියාපදිංචි වීමෙන් නම්, එම සහතිකයේ පිටපත් ඇමිණිය යුතුයි.)
(ඇ) ඔබ පරම්පරාවෙන් ලාංකිකයෙකු නම් උපන් ස්ථානය: ————.
(i) අයදුම්කරුගේ :————.
(ii) ඔබේ පියාගේ :————.
(iii) පිය පක්ෂයේ මුත්තාගේ :————.
(iv) පිය පක්ෂයේ මී මුත්තාගේ :————.

8. දැනට ලිපිනය :————.
එම ලිපිනයට ඉතා කිට්ටු පොලිස් ස්ථානය :————.

9. (අ) අවිවාහකද ? :————.
(ආ) අනියම් බිරිඳක් සිටීද ? :————.

10. දැනට කරන රැකියාව :————.

11. යුද්ධ හමුදාවේ සේවය කරන්නෙහිද ? නැතහොත් යුද්ධ හමුදාවේ හෝ ලංකාවේ එක්සත් රාජධානි කඳවුරුවල සේවය කළෙහිද ? :————.
(අස්වීමේදී දෙන ලද සහතිකයේ පිටපතක් අමුණන්න.)

12. අධ්‍යාපනික සුදුසුකම් :————.
(සමත්වී ඇති උසස්ම විභාගයේ සහතිකවල පිටපත් අමුණන්න.)

13. විශේෂ සුදුසුකම් තිබේද :————.

14. අයදුම්කරු ගැන විමසීම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :————.

15. (අ) ඔබ මීට පෙර පොලිස් සේවයට බැඳීමට ඉල්ලුම් කළෙහිද? ————.
එසේ නම් විස්තර දෙන්න :————.
(එවන ලද පිළිතුරේ පිටපතක් එවන්න.)
(ආ) ඔබ මීට පෙර පොලිස් සේවයේ සිටියෙහිද ? :————.

16. ඔබ හෝ ඔබේ කිසියම් ඥාතියකු යම්කිසි අපරාධයක් සම්බන්ධයෙන් නඩුවකට පැටලී උසාවියට කැඳවනු ලැබ, නඩු පවරනු ලැබ හෝ දඩුවම් ලබා හෝ ඇද්ද? එසේ නම් විස්තර සපයන්න :————.

ඉහත සඳහන් කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය ඒවා බව මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සැලකිය යුතුයි.—අයදුම්කරුවන් විසින් අවශ්‍ය කරුණු සිය අත් අකුරින්ම පුරවා ඉල්ලා ඇති සහතිකවල පිටපත් සමග පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි :—

පුහුණු කිරීමේ අධ්‍යක්ෂක,
පොලිස් අභ්‍යාස විද්‍යාලය,
ඇම්ලන් චතුරශ්‍රය,
කොළඹ 1.

8–159—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින වෛද්‍ය නිලධාරීන්, දන්ත ශල්‍ය වෛද්‍යවරුන් හා ආරෝග්‍යශාලා ලේකම්වරුන් සඳහා 1970 ඔක්තෝබර් මස පැවැත්වෙන අර්ධ වාර්ෂික විභාගය

1970 ඔක්තෝබර් මස 12 සහ 13 දිනයන්හි මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින වෛද්‍ය නිලධාරීන්, දන්ත ශල්‍ය වෛද්‍යවරුන් හා ආරෝග්‍යශාලා ලේකම්වරුන් සඳහා අර්ධ වාර්ෂික විභාගය පැවැත්වෙන බව මෙයින් නිවේදනය කරමි.

1970 ඔක්තෝබර් 13 රාජ්‍ය සේවා කොමිෂන් සභා රෙගුලාසි සහ පාලන නීති සංග්‍රහය, ආරෝග්‍යශාලා සහ බෙහෙත් හල් පරිපාලනය, ගණන් පත්‍රය.

2. සිංහල/දෙමළ වාචික පරීක්ෂණය 1970 ඔක්තෝබර් මස 12 වෙනි දින පවත්වනු ලැබේ.

3. මෙම විභාගයට ඇතුලත් වීම සඳහා ඉල්ලුම්පත් විමධ්‍යගත කොට්ඨාශ භාර ප්‍රධානීන්ගෙන් ලබාගත හැකි ආකෘති ප්‍රකාර විය යුතුයි.

4. මෙම විභාගය පවත්වනු ලබන්නේ විභාග කොමසාරිස් විසින් ය. ඔහු විසින් මෙම විභාගය පවත්වනු සඳහා පනවනු ලබන නීති රීති සම්බන්ධයෙන් ආධුනිකයින් යටත් විය යුතුයි.

5. ඉල්ලුම් පත් තම විමධ්‍යගත කොට්ඨාශ භාර ප්‍රධානීන් මගින් කොළඹ, මැලේ වීදියේ විභාග කොමසාරිස්තුමා වෙත 1970.9.1 දිනට මත්තෙන් යැවිය යුතුය. විමධ්‍යගත කොට්ඨාශ භාර ප්‍රධානීන් විසින් එම ඉල්ලුම් පත් 1970.9.1 දිනට ප්‍රථමයෙන් විභාග කොමසාරිස්තුමා වෙත ලැබීමට සලස්වනු පිණිස 1970.8.27 වන දිනට ප්‍රථමයෙන් සෑම ආධුනිකයෙකු විසින් ම ඔවුන්ගේ ඉල්ලුම් පත් අදාල විමධ්‍යගත කොට්ඨාශ භාර ප්‍රධානීන් වෙත යැවිය යුතු බව දැන ගත යුතුය.

6. 1970.8.27 වෙනි දිනට පසු ලැබෙන සෑම ඉල්ලුම් පතක් ම ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ.

ඩී. ඩී. විතානාච්චි,
වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන),
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1970 ජූලි මස 29 වන දා,
කොළඹ, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ දී ය.

8–153—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන අමාත්‍යාංශය

### රජයේ කලා හා කලා ශිල්ප විද්‍යාලයට සිසුන් බඳවා ගැනීම

රජයේ කලා හා කලා ශිල්ප විද්‍යාලයයේ 70-71 අධ්‍යයන වර්ෂයට ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඇතුළත් කර ගැනීම සඳහා ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන් අයදුම්පත් භාරගනු ලැබේ.

2. **පාඨමාලා :**

(අ) **දිවා පාඨමාලා** — මෙම පාඨමාලා හදාරන සියලුම ශිෂ්‍යයන් මුල් අවුරුදු 3 දී ඇඳීම හා පින්තාරු කිරීම පිළිබඳ පුහුණුවක් ලබා ගත යුතුය. තුන් වැනි අවුරුද්ද අවසානයේ දී පවත්වනු ලබන පරීක්ෂණයෙන් සාමාර්ථය ලබන ශිෂ්‍යයනට ඇඳීම හා පින්තාරු කිරීමේ තුන් අවුරුදු පාඨමාලා සහතික පත්‍රය පිරිනමනු ලැබේ. 4 වැනි හා 5 වැනි අවුරුදුවලදී ශිෂ්‍යයාට යෝග්‍ය වන පාඨමාලාවක් පිළිබඳ උසස් පුහුණුව ලබා දෙනු ඇත. පස්වැනි අවුරුද්ද අවසානයේ දී පවත්වනු ලබන අවසාන පරීක්ෂණයෙන් සාමාර්ථය ලබන අයට, හදාරණ ලද පාඨමාලාවට අදාළ ඩිප්ලෝමා උපාධිය පිරිනමනු ලැබේ. නුදුරු අනාගතයේ දී මෙම පාඨමාලා ප්‍රතිශෝධනයට භාජනය වන බව සැළකිය යුතුයි.

(ආ) **පස්වරු පාඨමාලා** — පිළිගත් ආයතනයක ස්ථිර රැකියාවක හෝ මෙම විෂය ක්ෂෙත්‍රයෙහි ආධුනිකත්වය දරන අය වෙනුවෙන් ග්‍රැෆික් හා වෙළඳ චිත්‍ර පිළිබඳ අවුරුද්දක පස්වරු පාඨමාලාව පැවැත් වේ.

(ඉ) **සන්ධ්‍යා පාඨමාලා** — පිළිගත් ආයතනයක ස්ථිර රැකියාවක හෝ මෙම විෂය ක්ෂෙත්‍රයෙහි ආධුනිකත්වය දරන අය වෙනුවෙන් ඡායාරූප ශිල්පය පිළිබඳ දැවුරුදු සන්ධ්‍යා පාඨමාලාවක් පැවැත් වේ.

3. **සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) ලංකාවේ පුරවැසියකු බව ;

(ආ) මනා චරිතයකින් යුක්ත බව ;

(ඉ) 1970. 10. 1 වැනි දිනට වයස අවුරුදු 16 ට නො අඩු විය යුතුයි. වයස 21 ට අඩු අයදුම්කරුවන්ට වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

(ඊ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ දෙවරකට නො වැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව, අංක ගණිතය/ගණිතය සහිතව විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වූවකු බව.

**සංලක්ෂ්‍යය.**—දිවා පාඨමාලාවට ඇතුළත්වීම සඳහා ඉල්ලුම් කරන්නන් චිත්‍ර කර්මයෙන් සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

4. **ප්‍රවේශ පරීක්ෂණය.**—ශිෂ්‍ය ශිෂ්‍යාවන් තෝරාගනු ලබන්නේ ප්‍රායෝගික සහ/හෝ ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි. ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණවලට පැමිණෙන අයදුම්කරුවන්ට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය සහ වෙනත් උපකරණ ඔවුන් විසින්ම සපයා ගත යුතුය.

5. **ප්‍රවේශ පත්‍ර හා කාල සටහන්.**—ඇතුළත්වීමේ විභාගයට පෙනී සිටීමට සුදුස්සන් වශයෙන් සැළකෙන අයදුම්කරුවන්ට විභාග ප්‍රවේශ පත්‍ර සහ කාල සටහන් එකී විභාගය ආරම්භ වීමට සති දෙකකට කලින් තැපෑලෙන් යවනු ලැබේ. විභාගය පවත්වන දිනය ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් නිවේදනය කරනු ලැබේ. විභාගය ආරම්භ වන දිනයට දින 7 කට පෙර, විභාග ප්‍රවේශ පත්‍ර සහ කාල සටහන් නොලැබුණු අයදුම්කරුවන්, පහත සඳහන් තොරතුරු සහිතව ඒ බව විදුලි පණිවුඩයකින් විද්‍යාලයාධිපති වෙත දැනුම් දිය යුතුය :—

(අ) අයදුම්කරුගේ නම ;

(ආ) තැපැල් කන්තෝරුව ;

(ඉ) ඉල්ලුම් පත්‍රය යවන ලද දිනය හා ලියාපදිංචි කළ අංකය.

6. **ගාස්තු.**—මෙම විද්‍යාලයේ ඉගෙනීම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් ගාස්තු අයකිරීමක් නැත.

7. **ආකෘති පත්‍ර.**—නියමිත ආකෘති පත්‍රවල ලියා එවන ඇතුළත්වීමේ ඉල්ලුම් පත්‍ර කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ පිහිටි රජයේ කලා හා කලා ශිල්ප විද්‍යාලයේ විද්‍යාලයාධිපති වෙත 1970. 8. 30 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. එම දිනයට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර භාර ගනු නොලැබේ. මෙම ආකෘති පත්‍ර 1970. 8. 25 වැනි දින දක්වා මෙම විද්‍යාලයේ කාර්යාලයෙන් ලබා ගත හැකිය. ඉල්ලුම් පත්‍ර ඉල්ලා එවන විට තමන්ගේ පෞද්ගලික ලිපිනය දරණ මුද්දර නො ගැසූ කවරයක් ද එවිය යුතුය. අසම්පූර්ණව හෝ සදොස් ලෙස පුරවා එවනු ලබන සියලු ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත.

එස්. එල්. ද සිල්වා,
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්,
(කාර්මික අධ්‍යාපනය)
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1970 ජූලි මස 28 දින,
කොළඹ 2, මාලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

8–106—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

1970-71 මුදල් වර්ෂය සඳහා පහත සඳහන් ද්‍රව්‍යයන් මිළයට ගැනීම සඳහා ටෙන්ඩර්, 1970 අගෝස්තු මස 30 දින උදේ 10.30 දක්වා මහර බන්ධනාගාර අධිකාරිතැන විසින් බාරගනු ලැබේ :—

(1) පොල් ගෙඩි 325 ක පමණ කුඩු දිනපතා.

(2) මුළුතැන්ගෙයි ඉතුරුවන ඉඳුල්කෑම ද්‍රව්‍යයන්.

2. ටෙන්ඩර් සඳහා රු. 10ක මුදලක් මෙම කාර්යාලයේ තැන්පත් කළ යුතුයි. එයට ලබාගත් රිසිට් පත ටෙන්ඩර් පත්‍රය සමග අමුණා එවිය යුතුයි. තමාගේ ටෙන්ඩරය භාරගත් බවට ලිපියකින් දන්වනු ලදුව නියමිත මාසික මුදල සෑම මාසයකම පළමුවෙනි දින ගෙවීමෙන් පසු ඉහත සඳහන් ද්‍රව්‍යයන් දිනපතා ගෙනයාමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩරය භාර ගත් බව දන්වන ලද ලිපිය ටෙන්ඩර්කරු විසින් දී තිබෙන ලිපිනයට තැපැල් කළහොත් හෝ ගෙනවිත් දුන්නහොත් එය ඔහුට ලැබුණ බව සළකනු ලැබේ.

3. ටෙන්ඩර්කරුවන් ඉඳුල්කෑම සහ පොල්කුඩු දිනපතා ගෙනයාම සඳහා මසකට ගෙවීමට කැමති මුදල සඳහන් කළ යුතුයි. සීල් තබන ලද ටෙන්ඩරය පහත සඳහන් කරන අයට එවිය යුතුයි. "පොල් කුඩු සහ ඉඳුල් කෑම මිළයට ගැනීම" යනුවෙන් කවරයේ වම් කෙළවරේ සටහන් කළ යුතුයි. සීල් තබන ලද ටෙන්ඩරය ඉහත සඳහන් දින දක්වා මා විසින් භාර ගනු ලැබේ. මේ සඳහා මුද්‍රිත ෆෝරම නැත.

4. මහර බන්ධනාගාර අධිකාරිතුමාගේ කාර්යාලයේදී, 1970 අගෝස්තු මස 30 දින උදේ 10.35ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටීමට පුළුවන.

5. මෙය සඳහා ලබාගත යුතු තවත් විස්තර පහත සඳහන් අයගෙන් ලබාගත හැක.

ජේ. පී. දෙල්ගොඩ,
මහර බන්ධනාගාර අධිකාරී,
රාගම.

8–102—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### සේවයට නුසුදුසු මෝටර් රථ (3) තුනක් විකිණීම

කිරුළපන මධ්‍යම කර්මාන්ත ශාලා භූමියේ ඇති පහත දැක්වෙන සේවයට නුසුදුසු මෝටර් රථ තුනක් විකිණීම සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතැන විසින් 1970. 8. 26 වන දින පෙ. ව. 11 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ :—

(1) 24 ශ්‍රී 978 (ෆෝර්ඩ් ඩීසල් කොන්වර්ෂන් ලොරිය, ඩයිනමෝව, ස්ටාටර් මෝටරය, සී. ඒ. වී. පොම්පය හා ඒ. සී. පොම්පය රහිතව)

(2) අයි. සී. 2911 (ඩොජ් කොන්වර්ෂන් ලොරිය, ඩයිනමෝව, ස්ටාටර් මෝටරය හා සී. ඒ. වී. පොම්පය රහිතව)

(3) සී. එල්. 7706 (බෙඩ්ෆෝර්ඩ් වතුර බවුසරය. ඇන්ජිම සහිතව).

2. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතැනගෙන් 1970. 8. 25 වන දින දහවල් 12 වන තෙක් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝර්මයක අනුපිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. කොළඹ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ ලංකා බැංකුවේ (යෝර්ක් වීදියේ) ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතැනගේ අංක 1 දරණ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක ටෙන්ඩර් කරන එක්

එක් වාහනයට රුපියල් 150 බැගින් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සි ටෙන්ඩර් පෝරමය ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

3. සියලුම පිරිනැමීම් හය මාසයකට වලංගු විය යුතුයි.

4. ටෙන්ඩර් පෝරමය බහාලු කවරය මුද්‍රාද තබා, එහි උඩ වම් කෙළවරෙහි "සේවයට නුසුදුසු රථවාහන මිළදී ගැනීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා, ඇචිලන් චතුරශ්‍රය, කොළඹ 1 යන ලිපිනයට එවිය යුතුයි. ටෙන්ඩර් ලියා පදිංචි කළ තැපෑලෙන් හෝ තමා විසින් ම ගෙනැවිත් දීමෙන් හෝ තමාගේ නියෝජිතයෙකුගේ මාර්ගයෙන් හෝ ප්‍රධාන ගණකාධිකාරි තැනට භාරදී ලැබුණු බවට කුවිතාන්සියක් ලබාගත යුතුයි. නැතහොත් ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

5. කොළඹ, ඇචිලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 1970.8.26 වන දින පෙරවරු 11 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

6. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් තමන්ගේ ටෙන්ඩරය පිළිගත් බැව් දැන්වූ විට ටෙන්ඩර් කරනු ලැබූ මුදල දින 10 ක් ඇතුලතදී ගෙවිය යුතුයි. ඊට පසු දින 14 ක් ඇතුලතදී ගන්නා ලද වාහනය අස්කරගත යුතුයි. බැහැර කිරීම සඳහා තමන් විසින්ම පිළිවෙලක් යොදාගත යුතුයි. නියමිත කාලය තුළදී අස්කර ගනු නොලබන වාහන නැවත විකිණීමෙන් හෝ අන් අයුරකින් හෝ ඉවත් කරනු ලැබේ. ඊට පසු ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අනුදැනුම ඇතිව විනා අන් කිසිම අයුරකින් වාහනය සඳහා ඉදිරිපත් විය නොහැක. යම් හෙයකින් සාර්ථක වූ ටෙන්ඩර්කරු කොන්ත්‍රාත්තුව පැහැර හැරිය හොත්, ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක වනවා පමණක් නොව රජයේ කොන්දේසි කඩකරන කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයටද ඔහුගේ නම ඇතුලත් වන්නේය.

7. ටෙන්ඩර් කිරීමට අපේක්ෂා කරන්නන් එසේ කිරීමට ප්‍රථමයෙන්, කිරුළපන මධ්‍යම කර්මාන්ත ශාලා භූමියෙහි ඇති වාහන පරීක්ෂාකර බැලීම යෝග්‍යය. ටෙන්ඩරයේ ඇති වන සියළුම වෙනස් කිරීම් හා මැකීම් ටෙන්ඩර්කරු විසින් සහතික කළ යුතුයි.

8. ටෙන්ඩර් පත්‍ර මුළුමණින්ම හෝ කොටස් වශයෙන් භාර ගැනීමේ හෝ නොගැනීමේ අයිතිය රජය සතුය.

9. ටෙන්ඩර් පෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකි වූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල්, ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනයට හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළ හොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

පී. එස්. සුබ්‍රමනියම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
ඇචිලන් චතුරශ්‍රය, කොළඹ 1,
1970.7.21 දින.
සිඊ/3/63

8–42—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

## ආහාර දෙපාර්තමේන්තුව

**අම්බලන්තොට, හම්බන්තොට, වීරවිල සහ කහඳව යන ස්ථානවල සිට සහල්, පිටි සහ අනෙකුත් ආහාර ද්‍රව්‍ය මාතර, බූස්ස, රත්නපුර සහ මොණරාගල යන ස්ථානවලට ප්‍රවාහණය කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව—1970–71**

1970.10.1 සිට 1971.9.30 දින දක්වා කාලය ඇතුළතදී ඉහත සඳහන් ප්‍රවාහන සේවාවන් සඳහා 1970 අගෝස්තු 25 දින ප. ව. 2.30 දක්වා කොළඹ 2, යූනියන් පෙදෙසේ අංක 330 දරණ ස්ථානයේ ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටැන්ඩර් භාරගනු ලැබේ.

2. තමන් සන්තකව ලොරි රථ ඇති හෝ අවශ්‍ය වූ විට ලොරි ප්‍රමාණවත් සංඛ්‍යාවක් සැපයීමට හැකි ප්‍රවාහකයින්ගෙන් පමණක් ටැන්ඩර් භාරගනු ලැබේ. තවද, ඔවුන්ට පැවරෙන ප්‍රවාහණ කොන්ත්‍රාත්තුව තමාගේ හෝ තමාට ලබා ගැනීමට හැකි ලොරිවලින් ඉටු කිරීමට ඔවුන්ට හැකියාවක් තිබිය යුතුය.

3. හම්බන්තොට නියෝජ්‍ය ආහාර පාලක කාර්යාලයෙන් හෝ කොළඹ 2, යූනියන් පෙදෙසේ අංක 330 දරන ස්ථානයේ ආහාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් 1970 අගෝස්තු 24 දින දහවල් 12 දක්වා රු. 250 ක ටැන්ඩර් තැන්පත් මුදලක් ගෙවා, ඉහත දෙවන ඡේදයේ සඳහන් කරුණු පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කොට ලබා ගත හැකි පෝර්මවල පිටපත් දෙකකින් යුතුව ටැන්ඩර් ඉදිරිපත් කළ යුතුය. වැඩි විස්තර හම්බන්තොට නියෝජ්‍ය ආහාර පාලක තැනගේ කාර්යාලයෙන් හෝ කොළඹ 2, යූනියන් පෙදෙසේ ආහාර කොමසාරිස් කාර්යාලයෙන් ලබාගත හැක.

බී. පී. ඩී. ඒ. ජේ. පී. සේනාරත්න,
ආහාර කොමසාරිස්.

330, යූනියන් පෙදෙස,
කොළඹ 2.

8–154—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

## අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ 8, මැගසින් පාරේ පිහිටි ලිපි ද්‍රව්‍ය ගබඩාවට පරණ පත්තර ටොන් 5ක් සැපයීම හා ගෙනැවිත් භාරදීම සඳහා ටෙන්ඩර් පත්, කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, බී. එස්. එස්. අයි. ගොඩකැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970.8.28 දින අ. භා. 2.30 දක්වා බාරගනු ලැබේ.

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට හෝ කොළඹින් බැහැර ඔනෑම කච්චේරියකට රු. 25ක මුදලක් තැන්පත් කොට ලබාගන්නා කුවිතාන්සිය, කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. මිළ ගණන් ලියා අනුපිටපතක් ද සහිතව ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය.

වැඩි විස්තර අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එන්. වාමදේව,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1970.7.29 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව.

8–127—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

කොළඹ 5, කිරුළ පාරේ අංක 200 දරණ ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් නල සහ ක්ලිප් සැපයීම සඳහා එවනු ලබන ටෙන්ඩර් පත්‍රිකා 1970 සැප්තැම්බර් මස 10 වෙනි දින පෙරවරු 10 වන තෙක් දේශීය සපයන්නන්ගෙන් බාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍රිකා නියමිත ලෙස ලියා අනුපිටපතකින් ද යුතුව එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ 5, කිරුළ පාරේ අංක 200 ස්ථානයෙහි වූ මණ්ඩලීය ප්‍රධාන ගිණුම් නිලධාරී තැන වෙත මුදලින් රු. 100 ක මුදලක් තැන්පත්කර ඒ සඳහා නිකුත් කරනු ලබන කුවිතාන්සිය මාගේ කාර්යාලය වෙත 1970 සැප්තැම්බර් මස 9 වෙනි දින පෙරවරු 12 ට පෙර ඉදිරිපත් කළ විටය. වැඩි විස්තර මාගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ප්‍රධාන සම්පාදක නිලධාරි තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

200, කිරුළ පාර,
කොළඹ 5.

8–141—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### පිත්තල මුද්‍රා සහ දින මුද්‍රා

පහත සඳහන් සේවාවන් සඳහා කොළඹ, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානයේ තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තු ප්‍රාදේශීය ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1970 අගෝස්තු මස 21 දින පෙ. ව. 10 වන තෙක් ටැන්ඩර් භාරගනු ලැබේ :—

(අ) තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාලවල සංකේත නාම යන් පිත්තල මුද්‍රා කැටයම් කිරීම. එකී පිත්තල මුද්‍රා පාවිච්චි කරනු ලබන කාර්යයන් ද එහි කැටයම් කළයුතුව ඇත.

(ආ) තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාලවල නම් ලෝහ දින මුද්‍රා එම්බොස් කිරීම හා එකී දින මුද්‍රා පාවිච්චි කරනු ලබන කාර්යයන් ද එම්බොස් කිරීම.

2. 1970 අගෝස්තු මස 21 වැනි දින පෙරවරු 10 ට ටෙන්ඩර් පත් විවෘත කරනු ඇත. ටැන්ඩර් පත් විවෘත කරන වේලාවේදී ටැන්ඩර් කරුවන්ට එහි පැමිණ සිටිය හැක.

3. කොළඹ 5, නාරාහේන්පිට, තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්ත මේන්තුවේ, උපකරණ, ගොඩනැගිලි, සුභසාධක හා ගබඩා පිළිබඳ සහකාර අධිකාරි කාර්යලයෙන් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රවල ටැන්ඩර් ඉදිරිපත් කළ යුතු ය.

4. ප්‍රධාන තැපැල් කාර්යාලයේ අංක 4 දරන කවුළුවේ රු. 50 ක මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබාගෙන එම රිසිට් පත ඉදිරිපත් කළ විට අවශ්‍ය ටැන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. 1970 අගෝස්තු මස 7 වැනි දින සිට 1970 අගෝස්තු මස 20 වැනි දින සවස 4.30 වන තෙක් ටැන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

5. වැඩි විස්තර, කොළඹ 5, නාරාහේන්පිට, තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ, ගොඩනැගිලි, උපකරණ, සුභසාධක හා ගබඩා පිළිබඳ සහකාර අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැක.

ඇම්. පී. ද සිල්වා,
සහකාර පෝස්ට්මාස්ටර් ජනරාල් (තැපැල් සේවා).

තැපැල් අංශය,
තැපැල් හා විදුලි සංදේශ මූලස්ථානය,
කොළඹ 1.

8–201—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාතීමේන්තුව

### මහඉළුප්පල්ලම උප කොටස

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහඉළුප්පල්ලමේ පහත සඳහන් නිවාස දෙක සෑදීම සඳහා අනුරාධපුර, උතුරු මැද කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරු තැන විසින් 1970.9.2 වෙනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් අයදුම් පත් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එදින, එවේලේම එහිදී සිදු කෙරේ.

2. පහත දක්වා ඇති වැඩ දෙක ඉදිරියෙන් දක්වා ඇති මුදලට හෝ ඊට වැඩි ගණනකට වාරිමාගී දෙපාතීමේන්තුවේ ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, සමූපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1970. 8. 10 වෙනි දින සිට 1970. 8. 29 වෙනි දින පෙරවරු 12 දක්වා අනුරාධපුර/මහකනදරාව/පදවිය/රාජාංගන වාරිමාගී ඉංජිනේරු කාර්යාල වලින් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ ඔවුන් දැනට කරන වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාගී ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළයුතුය.

4. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර ඒ ඒ වැඩය ඉදිරියෙන් දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් ඉහත සඳහන් වාරිමාගී ඉංජිනේරුවරුන් වෙත හෝ ලංකාවේ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබාගන්නා කාර්යාලයේ වාරිමාගී ඉංජිනේරු තැනට ඉදිරිපත් කළ යුතුය.

5. මෙම වැඩය පිළිබඳ සියළු විස්තර, සැලසුම් ආදිය මහඉළුප්පල්ලමේ පිහිටි මහවැලි ගංගා සංවර්ධන උප කොට්ඨාශ කාර්යාලයේ ඉංජිනේරු තැනගෙන් දැනගත හැක.

(1) වැඩය : සුළු සේවකයන් සඳහා සාද නිවාසයක් සෑදීම.
අවශ්‍ය ලියා පදිංචිය : රු. 23,500.
ටෙන්ඩර් තැන්පත් මුදල : රු. 25

(2) වැඩය : අවිවාහක නිලධාරීන් සඳහා සාද නිවාසයක් සෑදීම.
අවශ්‍ය ලියා පදිංචිය : රු. 30,000.
ටෙන්ඩර් තැන්පත් මුදල : රු. 50.

ඩබ්ලිව්. ඇස්. සබාරත්නම්,
අනුරාධපුර උප කොටසේ වාරිමාගී
ඉංජිනේරු තැන.

1970. 7. 28 වෙනි දින,
අනුරාධපුර වාරිමාගී කාර්යාලයේදීය.

8–170—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—ගාල්ල උප කොටස

70.7.10 දින ගැසට් පත්‍රයේ පළවූ දැන්වීමට යොමුව දෙන්න. ගේට්ටු සැපයීම සඳහා ටෙන්ඩර භාර ගැනීම 70.8.17 දින තෙක් මාදුගඟ ව්‍යාපාරයේ මාගල ඇල කරදිය ඉවත් කිරීමේ නිර්මිතයේ දීර්ඝ කර ඇත.

වාරිමාර්ග ඉංජිනේරු, ගාල්ල උප කොටස.

8–130—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

## විභාග දෙපාර්තමේන්තුව

### මුද්‍රණාලයේ කැපී ඉවතලන කඩදාසි

විභාග දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයේ කැපී ඉවත ලන කඩදාසි ටොන් දෙකක් පමණ මිල දී ගෙන යාම සඳහා මිල ගණන් 1970 අගෝස්තු මස 21 වැනි දින අපරභාග 2.30 වනතෙක් භාරගනු ලැබේ. විභාග දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයෙන් භාර ගන්නා හොණ්ඩරයක මිල සඳහන් කළ යුතුය.

2. මිල ගණන බහාලනු ලබන ලියුම් කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ " ඉවත ලන කඩදාසි සඳහා මිල ගණන් " යනුවෙන් සඳහන් කළ යුතුය. සීල් තබන ලද ලියුම් කවරය කොළඹ 2, මැලේ වීදියේ විභාග කොමසාරිස්තුමා ඉවත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

3. මිල ගණන් එවන ලද අයවළුන්ට ඒවා විවෘත කරන ඉහත කී වේලාවල දී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

4. මෙම කඩදාසිවල ආදර්ශයන් සතියේ රාජකාර්ය දිනවල පෙරවරු 9 සිට 4 දක්වාත් පෝ දිනට පෙර දිනවල පෙරවරු 9 සිට 11.30 දක්වාත් කොළඹ 2, මැලේ වීදියේ, විභාග මුද්‍රණාලයේ දී බැලීමට පුළුවන.

5. ටෙන්ඩරය භාරගත් බව දැනුම් දීමෙන් පසු දින තුනක් ඇතුළත මුළු මුදලම ගෙවා කඩදාසි තොගය ගෙන යා යුතුය.

කේ. ඊ. ඩබ්ලිව්. සුමනසූරිය,
විභාග කොමසාරිස්.

1970 ජූලි මස 27 වැනි දින,
කොළඹ 2, විභාග දෙපාර්තමේන්තුවේදී ය.

8–133—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

4. රත්මලානේ පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත් ටෙන්ඩර් ආකෘති පත්‍ර මත පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩරය සැකසිය යුතුය.

5. රත්මලානේ මහා මාර්ග දෙපාර්තමේන්තුවේ පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැනගේ කාර්යාලයේ සරප් වෙත රු. 25 ක මුදලක් ගෙවා, ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 1970 අගෝස්තු මස 19 වන දින සිට 1970 අගෝස්තු මස 26 වන දින පස්වරු 4.00 දක්වා කාල සීමාව තුල සාමාන්‍ය රාජකාරි වේලාවන් තුළදී ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

ඉන්පසු ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලබන්නේ ආපසු ගෙවනු නොලබන දිනකට රු. 10 ක්වූ අමතර ප්‍රමාද ගාස්තු ගෙවීමෙන් අනතුරුව පමණෙකි. තැපෑලෙන් එවනු ලබන ටෙන්ඩර් පත් ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. ටෙන්ඩර් පත් එවනු ලබන ලියුම් කවරවල වම් පැත්තේ උඩ කෙළවරේ " වතුර පොම්ප 15 ක් සහ අමතර කොටස් සැපයීම වෙනුවෙන් ටෙන්ඩර් පත් " යනුවෙන් සඳහන් කළ යුතුය.

6. 1970 සැප්තැම්බර් මස 3 වන දින පෙ. ව. 10.00 ට ප්‍රධාන ඉංජිනේරු තැනගේ කාමරයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරනු ලබන වේලාවේදී ටෙන්ඩර් කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට හෝ පැමිණ සිටිය හැකිය.

7. ලාංකිකයිනට හා ලාංකික සමාගම් සහ කොම්පැනිවලට පමණක් ටෙන්ඩර් සීමාවෙන් අසාර්ථකවූ ටෙන්ඩර් කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් සහ කොන්ත්‍රාත් කොන්දේසි අනුව කාර්යභාරය නිසි ලෙස ඉටු කරනු ලබන සාර්ථක ටෙන්ඩර් කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල්ද අයදුම් පත් අනුව ආපසු ගෙවනු ලැබේ.

8. තවදුරටත් විස්තර අවශ්‍යවේනම් රත්මලානේ මහා මාර්ග දෙපාර්තමේන්තුවේ පාලම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.

එස්. ජයවීරසිංහම්,
පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු.

1970 ක්වූ ජූලි මස 26 වන දින,
රත්මලානේ මහා මාර්ග දෙපාර්තමේන්තුවේ,
පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයේදීය.

8-33—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

පහත සඳහන් ස්ථානයන්හි විදුලි බල පේෂ කර්මාන්තශාලාවල විශ්‍රාම කාමර ඉදිකිරීම සඳහා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ පිහිටි කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1970 අගෝස්තු මස 29 වැනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ :—

(1) බණ්ඩාරවෙල
(2) මහගස්තොට
(3) බටගන්විල

2. යම්කිසි දෙපාර්තමේන්තුවක රු. 25,000 කට හෝ ඊයට වැඩි මුදලකට හෝ ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියා පදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ට මෙයට සහභාගි විය හැක.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගි වීමට කැමති කොන්ත්‍රාත් කරුවන් විසින් එක් වැඩකට රු. 100 බැගින් ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට 1970 අගෝස්තු 28 වන දින පෙරවරු 12 ට පෙර කුවිතාන්සි හා ලියා පදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබා ගත යුතු වේ.

ඩී. එච්. ජේ. අබේගුණසේකර,
අධ්‍යක්ෂ,
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව.

යොමු : 2/3/1/1/1, 2/3/1/1/2, 2/3/1/1/5.
1970 ජූලි මස 16 වෙනි දින,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1.

8-53—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1970 ක් වූ අගෝස්තු මස 28 වැනි දින පෙරවරු 10 වන තෙක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර්පත්‍ර කෑගල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාසැලේ නම | | වැඩෙහි ස්වභාවය |
|---|---|---|
| 1. කෑ/යක්ඇල්ල මහා විද්‍යාලය | 80×20 | පාසැල් ගොඩනැගිල්ලක් තැනීම. |
| 2. කෑ/පල්ලෙවත්ත විද්‍යාලය ... | 60×20 | පාසැල් ගොඩනැගිල්ලක් සහ වැසිකිලි දෙකක් තැනීම. |

සංලක්ෂ්‍යය : කෑ=කෑගල්ල දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශ කාර්යාලයේ හෝ කෑගල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කාර්යාලයේ හෝ රුපියල් 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය කෑගල්ල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන්, අධ්‍යාපන අමාත්‍යාංශයේ හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ රුපියල් 25,000 කට හෝ ඊට වැඩි මුදලකට ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1970 අගෝස්තු මස 25 වැනි දින දහවල් 12 වන තෙක් ටෙන්ඩර්පත්‍ර නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල් භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ කෑගල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත යුතුය. මුදල් බාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක්ය.

3. 2 වැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයට අධ්‍යාපන අමාත්‍යාංශයේ හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර්පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදල් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් 2 වැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයට වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර්පත්‍ර 2 වැනි සහ 3 වැනි ඡේදවල සඳහන් පරිදි කෑගල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් වැඩ සම්බන්ධව සියලු විස්තර දැනගත හැකි අතර, සැලසුම් ආදියද බලාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර්පත් ලියාපදිංචි කළ තැපෑලෙන් කෑගල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර්පත්‍ර කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පෞද්ගලිකව කෑගල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාලන නිලධාරී වෙත භාරදිය යුතුය. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

5. 1970 අගෝස්තු මස 28 වැනි දින පෙරවරු 10 ට කෑගල්ලේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර්පත්‍ර විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුගේ නම හා මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිළ ගණන්වලට මෙම වැඩ කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුය.

7. තවත් අවශ්‍ය විස්තර ඇතොත් කෑගල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර්පත්‍ර නිකුත් කිරීමේදී 1966.9.30 දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

ඩබ්ලිව්. ඩී. සී. මහතන්තිල,
කෑගල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1970 ජූලි මස 23 වැනි දින,
කෑගල්ල අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

8-100—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

## දෙපාර්තමේන්තු මෝටර් රථ මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවීම

පහත සඳහන් දෙපාර්තමේන්තු මෝටර් රථ මිලදී ගෙන ඉවත්කිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර, 1970 සැප්තැම්බර් මස 6 වැනි ඉරිදු පෙරවරු 9.30 දක්වා කොළඹ 5, කිරුල පාරේ, මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ, සර්වේ ජනරාල් විසින් භාරගනු ලැබේ.

| ලියාපදිංචි කළ අංකය | | වර්ගය | ඉල්ලුම් කළ යුතු අඩුම ගණන රු. | ශත |
|---|---|---|---|---|
| ඊ. වයි | 5647 | ... '' විලිස් '' යුනිවර්සල් ජීප් ... | 8,500 | 0 |
| 33 ශ්‍රී | 5539 | ... '' විලිස් '' පික්අප් ට්‍රක් 118 ... | 12,500 | 0 |
| 5 ශ්‍රී | 3358 | ... '' මිට්සුබිෂි '' ජීප් ජේ 20 ... | 12,500 | 0 |

2. මෙම වාහන දනට තිබෙන තත්ත්වයෙන් විකිණීමට පිරිනැමෙනවා ඇත. ප්‍රවාහන නිලධාරිගේ අවසරය ඇතිව කාර්යාල වේලාව ඇතුලත මෙම කාර්යාලයේදී ඒවා පරීක්ෂාකර බැලීමට පුළුවන.

3. එක් එක් රථයට ටෙන්ඩර් කරනු ලබන මිල වෙන් වෙන් වශයෙන් දක්විය යුතුයි. ඉහත සඳහන් ලිපිනය ඇති ස්ථානයේ දී රුපියල් පණහක (රු. 50) මුදලක් තැන්පත් කිරීමෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල, අනු පිටපතක් ද සහිතව ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කළ යුතුයි. තමාගේ ටෙන්ඩරය භාරගත් බවට ලියවිල්ලක් මගින් දන්වීමක් තමාට ලැබුණ දින සිට දින 5 ක් ඇතුලත තමා විසින් ටෙන්ඩර් කරන ලද මුදල් ප්‍රමාණය සම්පූර්ණ වශයෙන් ගෙවීමට යම් ටෙන්ඩර් කරුවකු ප්‍රතික්ෂෙප කළහොත් හෝ අසමත් වුව හොත්, ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක කරනු ලබන අතර වාහනය ඊලඟ වැඩිම ගණන ඉදිරිපත් කළ ටෙන්ඩර්කරු වෙත පිරිනමනවා ඇත. තවද ඔහුගේ නම, රජයේ කොන්දේසි කඩකල කොන්ත්‍රාත් කරුවන්ගේ නාමලේඛනයට ඇතුලත් කිරීමට ද ඉඩ තිබේ. පිලිගත් ටෙන්ඩර්කරු සම්පූර්ණ මුදල ගෙවා කෙදිනක් ඇතුලදී දනට තිබෙන භූමිභාගයෙන් වාහනය ඉවත් කළ යුතුයි.

4. 1970 අගෝස්තු මස 26 වෙනි බදාදා පස්වරු 4 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

5. මූලස්ථාන භාර සහකාර සර්වේ ජනරාල්ගේ කාමරයේදී 1970 සැප්තැම්බර් මස 6 වැනි ඉරිදු පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ඇත.

6. ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අවසරය ලත් නියෝජිතයින්ට කැමති නම්, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේ දී පෙනීසිටීමට අවසර දෙනු ලැබේ.

7. ටෙන්ඩර් වැසූ දින සිට සති 4 ක කාලයක්ම තමන් ඉදිරිපත් කරන ලද ගණන් විවෘත ව තබා ගැනීමට ටෙන්ඩර්කරුවන්ගෙන් බලාපොරොත්තු වනු ලැබේ.

8. '' මෝටර්වාහන මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් '' යනුවෙන් සඳහන් කොට, මුද්‍රා තැබූ ටෙන්ඩර්, කොළඹ 5, තැ. පෙ. 506, සර්වේ ජනරාල් කාර්යාලයේ මූලස්ථාන භාර සහකාර සර්වේ ජනරාල්, ඇස්. ජේ. මුණසිංහ මහතාට ලැබෙනසේ ලියාපදිංචිකළ තැපෑලෙන් එවිය යුතුයි.

9. ලියාපදිංචිකළ තැපෑලෙන් ටෙන්ඩර්පත්‍ර එවීමට අකැමැති ටෙන්ඩර් කරුවන්, පුද්ගලිකව හෝ ස්වකීය නියෝජිතයින් මාර්ගයෙන් හෝ ඒවා (ටෙන්ඩර්කරුගේ සේවා තොරතුරු, නම සහ ලිපිනය කවරයේ මතුපිට සඳහන් කොට) කොළඹ 5, තැ. පෙ. 506, සර්වේ ජනරාල් කාර්යාලයේ මූලස්ථාන භාර සහකාර සර්වේ ජනරාල් ඇස්. ජේ. මුණසිංහ මහතාට භාරදී ලදුපතක් ලබාගත යුතුයි.

10. ටෙන්ඩර් කරන ලද ගණන් ටෙන්ඩර් ආකෘති පත්‍රයේ ඉලක්කම් වලින් ලියා වචනවලින් ද නැවත ලිවිය යුතුයි. වචන හා/හෝ ඉලක්කම් අතර යම්කිසි වෙනසක් තිබුනොත් ටෙන්ඩර් පත්‍රය ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ තිබේ. ටෙන්ඩර් පත්‍රවල සියලුම වෙනස් කිරීම් හා මැකීම් ටෙන්ඩර් කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුයි.

11. තැන්පත් කළ ටෙන්ඩර් මුදල් 3 වැනි ඡෙදයේ සඳහන් කොන්දේසි වලට යටත්ව ආපසු ගෙවනු ලැබේ.

12. කිසියම් ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර හෝ ප්‍රතික්ෂෙප කිරීම සහ ටෙන්ඩරයක යම්කිසි කොටසක් පිළිගැනීම රජය වෙත පැවරී ඇති අවිවාදත්මක අයිතියකි.

13. වැඩිදුර තොරතුරු අවශ්‍ය නම්, කොළඹ 5, කිරුල පාරේ සර්වේ ජනරාල් කාර්යාලයේ ප්‍රවාහන නිලධාරීගෙන් ලබාගත හැකිය.

සී. ඊ. ගුණවර්ධන,
සර්වේ ජනරාල්.

1970 ජූලි මස 24 වැනි දින,
කොළඹ 5,
තැ. පෙ. 506,
සර්වේ ජනරාල් කාර්යාලයේ,
'' ප්‍රවාහණ '' අංශයේදිය.

8–38—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

යොමුව : පිළස්ඩී 1/34/70

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ඒසීඩී බෝතල් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ඒසීඩී බෝතල් සැපයීම සඳහා පහත සඳහන් උප ලේඛණයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.

(i) විදේශීය රටවල නම්ගිය නිෂ්පාදකයන්නෝ,

(ii) ලන්ඩන්හයේ රාජ්‍ය නියෝජිතයින්,

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්,

(iv) ඕස්ට්‍රියාව, පෝලන්තය, චෙකෝස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව, ස. සෝ. රු. ස., යුගෝස්ලේවියාව, එක්සත් අරාබි ජනරජය, බල්ගේරියාව, ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී ජන රජය, හංගේරියාව හා රුමේනියාව.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, තැ. පෙ. 584 හිමි කොළඹ, රැජින විදියේ සෙලින්කෝ මන්දිරයේ පස්වෙනි මාලයේ දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1970 නොවැම්බර් 10 දින පෙරවරු 10.00 තෙක් භාරගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදල ටෙන්ඩර ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛණ ගත කොට ඇති වෙළඳ සමාගම්වලින්,

(ii) 1 වැනි ඡෙදයේ (iv) වැනි උප ඡෙදයේ සඳහන් රාජ්‍යයන්ට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගින්ම පමණකි.

4. ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමති විදේශීය සමාගම්වලට අවශ්‍ය ටෙන්ඩර් කොන්දේසි, උප ලේඛන හා වෙනත් විස්තර ඉතාලිය, ඕස්ට්‍රේලියාව, ඇමෙරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍යය, පකිස්ථානය, ජපානය, ඉන්දියාව, බටහිර ජර්මනිය, ප්‍රංශය, කැනඩාව, නෙදර්ලන්තය, බෙල්ජියම, ඩෙන්මාර්ක්, ස්විට්සර්ලන්තය ආදී රටවල වෙසෙන ලංකා රජයේ නියෝජිතයින්ගෙන් ලබාගන්නා ලෙස එජන්ට්වරු සහ නියෝජිතයින් විදේශීය සමාගම්වලට උපදෙස් දිය යුතුයි.

5. ඉහත 2 වැනි ඡෙදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට ඉඩදෙනු ලැබේ.

6. මේ සම්බන්ධ විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 හි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබාගත හැක.

එන්. කේ. පී. විජයසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ,
1970 ජූලි 26.

### අදල උපලේඛනය

| *Item No.* | *Description* | *Estimated requirements* | *Packing required* |
|---|---|---|---|
| 1 .. | Sterile A.C.D. Bottles—Siliconized with vacuum Containing 60 ml A.C.D. solution B (U.S.P.) for 240 ml blood | 24,000 .. Bottles | In cartons of 12 bottles. |

8–156—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—අංගොඩ

පහත සඳහන් හිස් ගෝනි විකිණීම සඳහා අංගොඩ මානසික සෞඛ්‍ය සේවා අධිකාරි විසින් 27.8.70 වන දින දහවල් 10.30 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

| ද්‍රව්‍ය අංකය | | භාණ්ඩය | දළ වශයෙන් ප්‍රමාණය |
|---|---|---|---|
| 1. | හිස් ගෝනි ... ... | (හාල්) ... | 900 |
| 2. | එම ... ... | (සීනි) ... | 375 |
| 3. | එම ... ... | (පරිප්පු) ... | 550 |
| 4. | එම ... ... | (පිටි) ... | 1,050 |
| 5. | එම ... ... | (කුඩා) ... | 50 |
| 6. | එම ... ... | (සාමාන්‍ය) | 1,800 |
| 7. | එම ... ... | (ලුණු) ... | 50 |
| 8. | රෙදි ... ... | (පිටි) ... | 7,200 |
| 9. | හිස් බෝතල ... ... | (දෙඩම්) ... | 1,260 |
| 10. | හිස් පොලිතින් ... ... | මලු ... | 100 |
| 11. | කඩදසි ... ... | මලු ... | 200 |
| 12. | හිස් පොලිතින් ... ... | මලු (කුඩා) | 500 |
| 13. | වෙජිටබල් ... ... | ටින් ... | 75 |

2. ඉහත සඳහන් හිස් ගෝනි අංගොඩ මානසික රෝහලේ මුලුතැන්ගෙය, බේකරිය හා කිරිපට්ටියේදී පෙර පෝය දිනයන්හි හා පෝය දිනයන්හි හැර සතියේ දිනයන්හි පෙ. ව. 9. සිට ප. ව. 3.30 දක්වා පරීක්ෂාකර බැලිය හැක.

3. ටෙන්ඩර්කරුවන් විසින්ම ඔවුන්ගේ ටෙන්ඩර්පත්‍ර පිළියෙල කොට පිටපත් දෙකකින් යුතුව මුද්‍රා තබන ලද කවරයක බහා එවිය යුතුය. එම කවරයේ වම්පස උඩ කෙලවර හිස් ගෝනි විකිණීම සඳහා ටෙන්ඩර් යනුවෙන් සඳහන් කළ යුතුයි.

4. අංගොඩ මානසික සෞඛ්‍ය සේවා අධිකාරි වෙත රු. 50 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිය ටෙන්ඩරයට අමුණා එවිය යුතුය.

5. ටෙන්ඩර් පත්‍රයෙහි ඉහත සඳහන් පළමු ජේදයේ සඳහන් දිනයට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. නැතහොත් අංගොඩ මානසික රෝහලේ පාලක ලේකම් මහතා වෙත භාරදී එය ලැබුන බවට කුවිතාන්සියක් ලබාගත යුතුය.

6. කිසි ප්‍රශ්ණයක් නොමැතිව ටෙන්ඩර් සමහරක් හෝ සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේ සහ ඉන් එකක් හෝ භාර ගැනීමේ අයිතිය රජය සතුය. මෙම දැන්වීමේ ඇති සෑම කොන්දේසියක්ම නොපිළිපැද තිබුනොත් එවැනි ටෙන්ඩර් සලකා බලනු නොලැබේ.

7. පළමුවන ජේදයේ සඳහන් දිනය හා වේලාව මානසික සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරන අතර එම අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට එම ස්ථානයේ පෙනී සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ.

8. තේරුණු ටෙන්ඩර්කරු ටෙන්ඩරය පිළිගත්බව දන්වා දින 7 ක් ඇතුළතදී ඒ ඒ විෂය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද මිළ ගණන් සම්පූර්ණයෙන්ම අංගොඩ මානසික රෝහලේ වෛද්‍ය අධිකාරි වෙත ගෙවිය යුතුය. එලෙස මුදල් ගෙවා දින තුනක් ඇතුළතදී මේ භාණ්ඩයන් භාරගෙන මානසික රෝහල් භූමියෙන් ඉවත් කර ගත යුතුය.

9. ඉහත සඳහන් වන 8 වන ජේදයේ සඳහන් කොන්දේසි අනුව ක්‍රියා කිරීම අසමත් වුවහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරනු ලැබේ.

10. තවත් අවශ්‍ය විස්තර වෙතොත් අංගොඩ මානසික රෝහලේ වෛද්‍ය අධිකාරිගෙන් ලබා ගත හැක.

ඇම් .ජී. ජයසුන්දර,
මානසික සෞඛ්‍ය සේවා අධිකාරි.

අංගොඩ,
මානසික සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී ය.

8–131—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

ගලහ, රෝහලට පිවිසෙන මාර්ගයේ හානිවූ බෝක්කුව අලුත් වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර මහනුවර ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් 1970 ක්වූ සැප්තැම්බර් මස 11 දින පෙ. ව. 10.30 වන තෙක් භාරගනු ලැබේ.

මහනුවර/ගො/දෙ හි දිස්ත්‍රික් ඉංජිනේරුවරයාගෙන් ලබගාත් ආකෘති පත්‍රවල ටැන්ඩර් පත් පිළියෙළ කොට අනු පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුය. මේ පිළිබඳව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිවන අතර, සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයෙහිදී බලා ගැනීමට හැකිය.

ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 9,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් පමණක් ඉහත සඳහන් දිස්ත්‍රික් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය 1970 අගෝස්තු මස 24 වෙනි දා ප. ව. 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් ලබා ගැනීමට සුදුස්සන් වනවා ඇත. ටෙන්ඩර් පත් ප්‍රමාදවී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 ක් බැගින් වූ ආපසු නොගෙවනු ලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරියාට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබා ගත යුතුය.

ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම් කරු විසින් කොන්ත්‍රාත් කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තුවන අය ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලුම විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරයේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.
තවද ටෙන්ඩර් ලබා ගැනීමට අදහස් කරන අය තම තමන් විසින් දැනට කරගෙන යනු ලබන වැඩවල තත්වය හා ප්‍රගතිය දැක්වෙන ඒ ඒ දිස්ත්‍රික් ඉංජිනේරුවරුන්ගෙන් ලබා ගත් ලිපියක් තමන් වෙත ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර ඉදිරිපත් කළ යුතුවේ.

සී. යෝගරාජා,
මධ්‍යම කොට්ඨාශයේ අධිකාරී ඉංජිනේරු (ගො).

අධිකාරී ඉංජිනේරු කාර්යාලය,
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
මහනුවර,
1970. 7. 28.

8–173—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

කෑගල්ලේ නව රෝහලේ දවනයක් හා ධූමාලයක් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර මහනුවර ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් 1970 ක්වූ සැප්තැම්බර් මස 11 දින පෙ. ව. 10.30 වන තෙක් භාරගනු ලැබේ.

මහනුවර/ගො/දෙ හි දිස්ත්‍රික් ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්‍රවල ටැන්ඩර් පත් පිළියෙළ කොට අනු පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුය. මේ පිළිබඳව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිවන අතර, සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයෙහිදී බලා ගැනීමට හැකිය.

ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 37,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් පමණක් ඉහත සඳහන් දිස්ත්‍රික් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය 1970 අගෝස්තු මස 24 වෙනි දා ප. ව. 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් ලබා ගැනීමට සුදුස්සන් වනවා ඇත. ටෙන්ඩර් පත් ප්‍රමාදවී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 ක් බැගින් වූ ආපසු නොගෙවනු ලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරියාට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබා ගත යුතුය.

ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම් කරු විසින් කොන්ත්‍රාත් කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තුවන අය ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලුම විස්තර අඩංගු කළයුතු ආකෘති පත්‍ර නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරයේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

තවද ටෙන්ඩර් ලබා ගැනීමට අදහස් කරන අය තම තමන් විසින් දැනට කරගෙන යනු ලබන වැඩවල තත්වය සහ ප්‍රගතිය දැක්වෙන ඒ ඒ දිස්ත්‍රික් ඉංජිනේරුවරුන්ගෙන් ලබා ගත් ලිපියක් තමන් වෙත ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර ඉදිරිපත් කළ යුතුවේ.

ඕ. යෝගරාජා,
මධ්‍යම කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු (ගො).

අධිකාරී ඉංජිනේරු කාර්යාලය,
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
මහනුවර,
1970. 7. 28.

8–174—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### සේවයට නුසුදුසු බඩු විකිණීම

මරදානේ පිහිටි තැපැල් සහ විදුලි සංදේශ ගබඩාවේ තබා ඇති සේවයට නුසුදුසු බඩු බාහිරාදිය විකිණීම සඳහා, කොළඹ 1, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ, ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලයේ ගැනුම්පත් මණ්ඩලයේ සභාපති විසින් 1970 අගෝස්තු මස 28 වෙනි දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

2. කොළඹ 1, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ, 5 වෙනි මහලේ, ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලයෙන් ලබා ගත් ෆෝර්මවලින් පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් කාර්යාලයේදී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කර බැලීමට ද, අවශ්‍ය විස්තර දැන ගැනීමට ද පුළුවන.

3. තැපැල් කාර්යාලයක හෝ මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ විදුලි පණිවුඩ කැෂියර් වෙත හෝ ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රුපියල් 50 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිය ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමෙන් 1970 අගෝස්තු මස 21 වෙනි දින දවල් 12 වන තෙක් බලාපොරොත්තු ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් ඉල්ලුම්පත් ලබාගත හැකිවේ.

වී. අලගරත්නම්,
ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු.

ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලය,
තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානය,
ලෝටස් පාර, තැ. පෙ. 503,
කොළඹ 1.

8–169—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

## ලංකා පිගන් සංස්ථාවේ නව භෝජනාගාරය පවත්වාගෙන යාමේ කොන්ත්‍රාත්තුව

සේවක සේවිකාවන් 500 දෙනෙකුට පමණ, සංස්ථාවේ අළුතින් ඉදි කරන ලද භෝජනාගාරයේදී කැන්ටින් සේවාවක් අවුරුදු 2 ක කාලයක් තුළ පවත්වාගෙන යාම සඳහා ලංකා පිගන් සංස්ථාව විසින් එම සේවය පිළිබඳ මනා පළපුරුද්දක් ඇති අයගෙන් මිල ගණන් පත් කැඳවනු ලැබේ.

මිල ගණන් පත්, 1970 අගෝස්තු මස 12 දින පස්වරු 4 දක්වා සංස්ථාවේ සාමාන්‍යාධිකාරී විසින් භාරගන්නවා ඇත.

අදාළ ලියකියවිලි, රු. 100ක (ආපසු ගෙවනු ලබන) ටෙන්ඩර් තැන්පත් මුදලක් සහ රු. 10 ක (ආපසු ගෙවනු නොලැබෙන) ටෙන්ඩර් ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් පසු, 1970.8.11 දින දහවල් 12 දක්වා ලබාගත හැක.

වැඩි විස්තර පහත සඳහන් අයගෙන් ලබාගත හැක.

සැපයීම් කළමණාකරු.

ලංකා පිගන් සංස්ථාව,
සැපයීම් හා වාප්පු දෙපාර්තමේන්තුව,
අංක 55, රොස්මීඩ් පෙදෙස,
කොළඹ 7.

8–178—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පූනකරි ව්‍යාප්ති මධ්‍යස්ථානයෙහි ළිඳක් කැනීම සහ ඉදිකිරීම

යාපනයේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි විසින් පහත සඳහන් කටයුතු සඳහා සීල් තබන ලද ටෙන්ඩර්පත්‍ර 1970. 8. 21 දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ :—

(1) විෂ්කම්භය අඩි 6 ක් හා ගැඹුර අඩි 20 ක ළිඳක් කැනීම සහ ඉදිකිරීම.

(අ) දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි, යාපනය හෝ ඔහුගේ නියෝජිතයා විසින් ළිඳ කනින ස්ථානය පෙන්වනු ලැබේ. කපාගත් පස් සහ සුන්බුන් පසුව පිරවීමට පාවිච්චි කිරීම සඳහා කනින ස්ථානයට ආසන්නවම ගොඩගසා තැබිය යුතුය. ගල් මට්ටමේ සිට 5" ඝන කොන්ක්‍රීට් ගඩොල් (1 : 3 :6) වලින් බිත්ති තැනිය යුතු අතර ඇතුළත සිමෙන්තියෙන් (1 : 3) බදාමෙන් කපරාරු කළ යුතුය. ආරක්ෂක බිත්තිය බිම මට්ටමේ අඩි 2 ක උසින් විය යුතුය.

(ආ) භාණ්ඩ සියල්ලක්ම කොන්ත්‍රාත්කරු විසින්ම සපයා ගත යුතුය.

(ඇ) ගිවිසුම අත්සන් කළ දින සිට සති 8 ක් ඇතුළත දී වැඩ නිම කළ යුතුය.

2. මෙම ටෙන්ඩර්පත්‍ර යාපනයේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරියාගෙන් ලබා ගත හැක. සියලුම ටෙන්ඩර් දෙපිටපතින් යුක්ත විය යුතුය. අත්සන් කළ ටෙන්ඩර්පත්‍ර කවරයක බහා සීල් තබා කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ "ළිඳක් කැනීම යනාදිය සඳහා ටෙන්ඩර්" යනුවෙන් ලියා යාපනයේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි වෙත එවිය යුතුය.

3. ටෙන්ඩරයකට රු. 10 බැගින් මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන්, ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දිනට පෙර දින දහවල් 12 වන තෙක් ටෙන්ඩර්පත්‍ර නිකුත් කරනු ලැබේ. මෙම තැන්පත් මුදල කැමති කච්චේරියක හෝ පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ තැන්පත් කළ හැකිය. ගිවිසුම් පත්‍රය අත්සන් කළ පසු මෙම තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ. ටෙන්ඩර්පත්‍රය පිළිගන්නා ලද බව දැන්වූ දින සිට දින 10 ඇතුළත, ගිවිසුම් පත්‍රයට අත්සන් තැබීමට හෝ අවශ්‍ය ඇප මුදල් තැන්පත් කිරීමට හෝ පිළිගත් ටෙන්ඩර්කරු අපොහොසත් වුව හොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වනවා හැර ඔහුගේ නම වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට ඇතුලත් කිරීමට හේතුවේ. එහෙත් එසින් රජයට ඔහුගෙන් අයවිය යුතු වෙනත් මුදලක් ඇතොත් එම අය කර ගැනීම්වලට බාධාවක් ඇති නොවේ.

4. ටෙන්ඩර්පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නොඑවන්නේ නම්, තමන්ම හෝ තම නියෝජිතයා හෝ කවරයක බහා සීල් තැබූ කවරයේ උඩ "ළිඳක් කැනීම යනාදිය සඳහා ටෙන්ඩර්" යනුවෙන් ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය සහිතව ලියා යාපනයේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනගේ කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ පුද්ගලිකව තැන්පත් කළ යුතුය.

5. ලියාපදිංචි කළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර්පත්‍ර ලැබුනු බවට ටෙන්ඩර්පත්‍ර අරින දින දී ටෙන්ඩර්කරුවන් සියලුදෙනාටම දන්වනු ලැබේ. යම් ටෙන්ඩර්කරුවෙකුට ටෙන්ඩර් කැඳවීමේ අවසාන දින සිට දවස් 4 ඇතුළත ටෙන්ඩර්පත්‍ර ලැබුණු බවට දැන්වීමක් නොලැබුන හොත් වහාම යාපනයේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරියෙන් විමසිය යුතුය.

ටෙන්ඩර් විවෘත කරන වේලාවෙහිදී පෙනී සිටීමට ටෙන්ඩර්කරුවන් කැමති නම් ඔවුන්ට ඒ සඳහා අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරනු ලබන්නේ මෙම ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දිනයේ දී හා ඒ සඳහා නියමිත වේලාවේ දී යාපනය දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනගේ කාර්යාලයේ දීය.

6. පිළිගත් පෝර්මයෙහි (දෙපිටපතින් යුතුව) ඉදිරිපත් නොකරණ ලද හෝ එහි සඳහන් කොන්දේසිවලට සම්පූර්ණ වශයෙන්ම එකඟ නොවන්නා වූ කිසිම ටෙන්ඩර් පත්‍රයක් පිළිගනු නොලැබේ. ටෙන්ඩර් ගාස්තු ප්‍රමාණය හා මිළ ගණන් තීන්තෙන් පැහැදිලි ලෙස සටහන් කළ යුතු අතර, සියළුම වෙනස්කිරීම්වලට ටෙන්ඩර්කරුගේ අත්සන් යොදා සහතික කළ යුතු වේ.

7. ටෙන්ඩර්කරුවන් විසින් තමන්ගේ නම සහ ලිපිනයන් සම්පූර්ණ ලෙස පැහැදිලි අකුරින් සටහන් කර තිබිය යුතුයි.

8. පිළිගත් ටෙන්ඩර්කරුට, ගිවිසුමකට එළඹීමට සිදු වන අතරම ටෙන්ඩර් කරන ලදුව, පිළිගනු ලැබුවා වූ වැඩ කොටස්වල මුළු වටිනා කමින් සියයට 5 ක මුදලක්, කෘෂිකර්ම අධ්‍යක්ෂක නමින් තැන්පත් කිරීමට සිදු වේ. මෙම මුදල ආපසු ගෙවනු ලබන්නේ කොන්ත්‍රාත්තුව සාර්ථක ලෙස ඉටු කළ පසුය. පිළිගත් ටෙන්ඩර්කරුට කොන්ත්‍රාත්තුව සාර්ථක ලෙස ඉටු කිරීමට නොහැකි වුවහොත්, ඔහුගේ තැන්පත් මුදල රාජ සන්තක කර රජය මඟින් තබා ඇති, වැඩ පැහැර හරින ලද කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයෙහි එම ටෙන්ඩර් කරුගේ නම ද ඇතුලත් කරනවා ඇත.

9. ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දින සිට සති තුනක් තුළ භාර ගැනීම සඳහා තම ටෙන්ඩර්පත්‍ර විවෘතව තැබීමට ටෙන්ඩර්කරු වන්ට සිදුවේ.

10. ගිවිසුම් පත්‍රයට අලවන මුද්දර සඳහා තම අතින් වියදම් කිරීමට පිළිගත් ටෙන්ඩර්කරුට සිදුවේ.

11. කිසියම් ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේ අයිතියත්, ටෙන්ඩරයක කොටසක් පමණක් පිළිගැනීමේ අයිතියත් කෘෂිකර්ම අධ්‍යක්ෂක සතුවේ.

12. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු හා දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වන අතර, ඔවුහු පමණක් එසේ නියුක්ත කරනු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගනු ලබන්නේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටිය අය අතුරිණි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විධියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩුදෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවල දී කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව නිශ්චිතව ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතර එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සලකනු ලැබේ.

මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය පරිදි "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියකු අදහස් කරන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුලත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණවූද, කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූලවූද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙයි.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පතපොත, චෙක්රෝල් පොත්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂාකර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විසින් විධිමත් ලෙස බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩදීමට කොන්ත්‍රාත්කරු බැඳි සිටී.

13. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුනහොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපැලෙන් යැව්වොත් හෝ ඔහු අතටම භාරදුන්නා සේ සළකනු ලැබේ.

14. කිසියම් සේවකයෙකු සේවයේ යෙදවීමට අහිතකර යයි රජය සලකනු ලබන විටක හා කිසියම් සේවකයෙකු කොන්ත්‍රාත්කරු විසින් සේවයට ගැනීමට විරුද්ධවීමේ අයිතිය රජය සතු වේ.

15. කොන්ත්‍රාත්කරු විසින් සේවයේ යොදවන ලද කම්කරුවෙකු විසින් වර්ෂ 1934 අංක 19 වෙනි කම්කරු වන්දි ආඥාපනතෙහි (117 වෙනි අධිකාරය යටතේ) ඉල්වනු ලබන වන්දියකින් රජය නිදහස් කිරීමට කොන්ත්‍රාත්කරුට සිදුවේ.

16. තනි වශයෙන් හෝ වෙනත් අයෙකුගේ නමක් සමග රජයේ කොන්ත්‍රාත්තු පැහැර හරින ලද කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයෙහි නම් සඳහන් කිසිවෙකු සමග හෝ තමාට සැහේයයි හැඟියන කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විරුද්ධවන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

17. යාපනයේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරිගෙන් මේ සම්බන්ධ වැඩි විස්තර ලබාගත හැක.

පී. මානික්කවාසගර්,
දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි, යාපනය.

දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති කාර්යාලය,
මහ ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල,
යාපනය, 1970 ජූලි 27.

8–176—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

ත්‍රිකුණාමලය, මහනුවර, නුවර එළිය, අම්පාර සහ අනුරාධපුරය යන දිස්ත්‍රික්කවල පහත සඳහන් නි.මි.යෝ.ත්‍ර. ගබඩා ඉදිකිරීම සඳහා කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 අගෝස්තු මස 28 වැනි දින ප.ව. 2.30 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

| දිස්ත්‍රික්කය | ස්ථානය | ගොඩනැගිලි ගණන |
|---|---|---|
| ත්‍රිකුණාමලය | ... පාන්කුලම් | ... එකයි (1) |
| මහනුවර ... | ... මොරයාය | ... එකයි (1) |
| නුවර එළිය | ... රිකිල්ලගස්කඩ | ... එකයි (1) |
| අම්පාර ... | ... කෝමාරිය | ... එකයි (1) |
| අනුරාධපුරය | ... රාජාංගනය | ... එකයි (1) |

2. එක් එක් ගබඩාවක් සඳහා රු. 250 බැගින් (රුපියල් දෙසිය පණහක්) වෙන් වශයෙන් තැන්පත් කර ඒ සඳහා ලබා ගන්නා ලද කුවිතාන්සි ඉදිරිපත් කර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබා ගන්නා ලද ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ, අංක 60 දරණ ස්ථානයේ ගණකාධිකාරිට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක මුදල් තැන්පත් කළ හැක.

3. රු. 30,000 ක් හෝ ඊට වැඩි ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රජයේ බලය ලත් කොන්ත්‍රාත්කරුවනට පමණක් (කොන්ත්‍රාත්කරුවන්ගේ සට හන් පොත) ඉදිරිපත් කිරීමෙන් 1970 අගෝස්තු මස 27 වෙනි දින දවල් 12.00 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. තැපැලෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලා සිටින ටෙන්ඩර් කරුවන් විසින් ඒවා ලබා ගෙන අවසාන දිනට ප්‍රථම එවීමට හැකිවන පරිදි කල්වේලා ඇතිව එසේ කළ යුතුය.

4. වැඩි විස්තර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබාගත හැකිය.

එස්. බී. සේනානායක,
ගොවිජන සේවා කොමසාරිස්.

1970 අගෝස්තු මස 7 වැනි දින,
කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ,
අංක 42 දරණ ස්ථානයේ,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේදීය.

8–165—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

# තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

සොරොව් දොරටු 59ක් සැපයීම සඳහා ටෙන්ඩර්

ටෙන්ඩර් ප්‍රතිඵල

| ලැබුණු ටෙන්ඩර් ගණන | සාර්ථක ටෙන්ඩර්කරුගේ නම | පිළිගත් ටෙන්ඩරයේ මුදල රු. |
|---|---|---|
| දහහතරයි (14) | ආර්. ධන්කත් ද සිල්වා මහතා, 242, පිකරින්ස් පාර, කොළඹ 13. | 51,400 |

ඇල්. ඕ. ද එස්. ගුණසේකර,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 7,
1970 ජූලි මස 26 වැනි දින දිය.

8–132—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

# බඩු බාහිරාදිය විකිණීම්

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පරිහරණයට නුසුදුසු භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

මෙම දෙපාර්තමේන්තුවේ කොළඹ 7, ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයේ පරිහරණයට නුසුදුසු පහත සඳහන් භාණ්ඩ 1970 අගෝස්තු මස 24 දින පෙරවරු 10 ට මෙම කාර්යාල භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1. එකතු කිරීමේ යන්ත්‍ර ... 1 යි.
2. එක්සයිඩ් බැටරි (පරණ) ... 1 යි.
3. ඉම්පීරියල් යතුරු ලියන ... 1 යි
4. ටයර් 650×16 ... 4 යි.

2. අවසාන මිටි පහර පතිත වනවාත් සමග සම්පූර්ණ මුදල් ගෙවිය යුතු අතර, වෙන්දේසිය පැවැත්වෙන දින පස්වරු 4 ට පෙර සියලුම භාණ්ඩ මෙම කාර්යාලයෙන් ඉවත් කරගත යුතු වේ.

3. මෙම භාණ්ඩ 1970 අගෝස්තු මස 7 දින සිට වෙන්දේසිය පැවැත්වෙන දිනය දක්වා රාජකාරි වේලාවන් තුළ මෙම කාර්යාලයේදී පරීක්ෂා කළ හැකිය.

ඒ. ඩබ්ලිව්. පෙරේරා,
පරිපාලන නිලධාරි (ගොවිපල් පාලන හා නිෂ්පාදන),
කොළඹ.

1970 ජූලි මස 27,
ගො. පා. හා. නි. කායාලය, තැ. පෙ. 622,
වෝඩ් පෙදෙස, කොළඹ 7.

8–160—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

## රේගුවේ වෙන්දේසියක්

කොළඹ රේගුවේ ඩෙල්ෆ්ට් තටාක ගුදමේ තැන්පත් පහත සඳහන් බඩු 1970 අගෝස්තු මස 19 වෙනි දින පෙ. ව. 10 ට එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1970 අගෝස්තු මස 18 වෙනි දින එම බඩු ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලීමට පිළිවන.

මෙම වෙන්දේසියෙන් මිලයට ගත් බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැළකිය යුතුය.

ඇස්. ඒ. සන්සෝනි,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : ඒඩී/විකිණීම්/29.

1970 ජූලි මස 30 වෙනි දින,
කොළඹ රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

1. ඔතන කඩදාසි රෝල් 1 යි.
2. සහ 4. ප්ලාස්ටික් ෂීට් කාටුන් 1 යි
5. ප්ලාස්ටික් ෂීට් තොග 1 යි
6. ටයර් 8 යි
7. නූල් පෙට්ටි 1 යි
8. බෙහෙත් ද්‍රව්‍ය කාටුන් 1 යි
9. රබර් රෝද මලු 1 යි
10. ට්‍රැක්ටර් අමතර කොටස් පෙට්ටි 1 යි
11. ඔලිව් තෙල් ටින් 17 යි
12. බෙහෙත් ද්‍රව්‍ය කාටුන් 1 යි
13. අත් වියන යන්ත්‍ර නූල් පෙට්ටි 1 යි
14. සම් රෙදි රෝල් 1 යි
15. යන්ත්‍ර කොටස් කෑලි 1 යි
16. විදුරු චිමිනි කාටුන් 1 යි
17. මුද්‍රණ කඩදාසි බේල් 2 යි
18. හිස් බෝතල් පෙට්ටි 1 යි
19. කපු නූල් කාටුන් 1 යි
20. විදුරු තහඩු පෙට්ටි 1 යි
21. පොලිස් මලු 3 යි
22. ට්‍රැක්ටර් බෝල් රේසර් පෙට්ටි 1 යි
23. යන්ත්‍ර අමතර කොටස් මලු 1 යි
24. යන්ත්‍ර අමතර කොටස් මලු 1 යි
25. ප්ලාස්ටික් ෂීට් පෙට්ටි 1 යි
26. සෝප් කාටුන් 1 යි
27. ගැල්වනයිස් කම්බි රෝල් 1 යි
28. ග්‍රීස් ඩ්‍රම් 1 යි
29. කපු නූල් පෙට්ටි 1 යි
30. සායම් ආදිය ටින් 23 යි
31. කිරිපොවන බෝතල් කාටුන් 1 යි
32. එලවළු ඇට මලු 3 යි
33. බිරලු මලු 4 යි
34. බෙහෙත් ද්‍රව්‍ය බෙර 1 යි (තුනීලැලි)
35. මෝටර් දුනු 10 යි
36. හිස් බෝතල් තොග 1 යි
37. මුරිච්චි මලු 1 යි
38. මැලියම් කුඩු තොග 1 යි
39. ජෑම් පෙට්ටි 1 යි
40. රසායන ද්‍රව්‍ය මලු 24 යි
41. ඉන්ජින් හෙඩ් 1 යි
42. බදාම මලු 15 යි
43. ටොයිලට් පේපර් රෝල් 1 යි
44. සම් රෙදි රෝල් 5 යි
45. රෙඩ් ඔක්සයිඩ් මලු 4 යි
46. කුඩ තණ මලු 1 යි
47. රවුන් ටින් ප්ලේට් පෙට්ටි 1 යි
48. විදුලි බුබුළු කාටුන් 3 යි
49. ලීටර කිරි පිටි ටින් 2 යි
50. යන්ත්‍රෝපකරණ ක්‍රේට්ස් 9 යි
51. කාඩ්බෝඩ් තොග 1 යි
52. පාවිච්චි කරන ලද ඇඳුම් තොග 1 යි
53. පාවිච්චි කරන ලද ඇඳුම් තොග 1 යි
54. පාවිච්චි කරන ලද ඇඳුම් තොග 1 යි
55. පාවිච්චි කරන ලද ඇඳුම් තොග 1 යි
56. පාවිච්චි කරන ලද ඇඳුම් තොග 1 යි
57. පාවිච්චි කරන ලද ඇඳුම් තොග 1 යි.

8–200—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ 1970–71 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද නැවත විකිණීම

අංක 14,910 හා 1970 ජූනි මස 11 වැනි දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ " කුරුණෑගල දිස්ත්‍රික්කයේ 1970–71 වර්ෂය සඳහා රා රේන්ද විකිණීම " යන ශීර්ෂය යටතේ පළ කරන ලද සියළුම කොන්දේසිවලට යටත්ව පහත සඳහන් රා තැබෑරුම් වල රේන්ද නැවත විකිණීම සඳහා කුරුණෑගල දිසාපති විසින් 1970 අගෝස්තු මස 21 දින වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

| තැබෑරුමේ අංකය හා නම | | 1970 අගෝස්තු මස 21 වන දී එක් එක් තැබෑරුම වෙනුවෙන් ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාවල් |
|---|---|---|
| අංක 1—ගිරිඋල්ල | ... | පෙරවරු 10.00 |
| අංක 2—උඩුබද්දව | ... | පෙරවරු 10.30 |
| අංක 4—නාරම්මල | ... | පෙරවරු 11.00 |
| අංක 5—කටුපිටිය | ... | පෙරවරු 11.30 |

හී. බ. දිසානායක,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 ජූලි මස 16 දින,
කුරුණෑගල දිසාපති කාර්යාලයේදීය.

8–35—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## වෙන්දේසියේ විකිණීමක්

**වැල්ලවත්තේ කොටා ලේන් (දැන් සුවිසුද්ධාරාම පාර) අංක 83 දරන ඉඩම එහි තනා තිබෙන අත්තිවාරමද සමග**

ජාතික නිවාස සහකාර කොමසාරිස් ඩී. ඇස්. වීරසිංහ මහත්මා විසින් මා වෙත නිකුත් කර තිබෙන බලය ප්‍රකාර කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඇස්. ගුණසේකර මහතා විසින් 1958.1.22 වන දින සහතික කරන ලද අංක 701 දරන උකස්කරය යටතේ, කොළඹ 5 පර්සිෆ් පාරේ අංක 93 දරන ස්ථානයේ පදිංචි ඇම්. ඒ. හොප්මන් මහතා විසින් 1969.5.1 වන දිනට ගෙවිය යුතු මුදල රුපියල් 13,962.06 ක් නොගෙවූ නිසා එම මුදල සහ රුපියල් 10,000 කට 1969.5.1 වන දින සිට ඉඩම වෙන්දේසි කරන දින දක්වා හෝ එම මුදල සම්පූර්ණයෙන් ගෙවනතුරු වසකට 4% ගණනේ පොලියද, යථෝක්ත උකස්කරය ප්‍රකාර 1969.5.1 වෙනි දින සිට එම මුදල් සම්පූර්ණයෙන් ගෙවනතුරු හෝ ඉඩම වෙන්දේසි කරන දින දක්වා එකතුවන සියලුම දඩ මුදල් සමග අයකර ගැනීමත්, එසේ අයකර ගැනීමේදී දැරීමට සිදුවන වියදම් සහ ගාස්තුද අයකර ගැනීම සඳහා වර්ෂ 1970 ක්වූ අගෝස්තු මස 30 වෙනි ඉරිදා අ. භා. 4 ට මෙහි පහත සඳහන් ඉඩම එම ස්ථානයේදී ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ, එනම් :—

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ කොළඹ නාගරික සභා සීමාව තුළ වැල්ලවත්තේ පිහිටි අංක 2 දරන ලියා පදිංචි සැලැස්මේ සඳහන් පී. ඩී. වොරන් මිනුම් ජනරාල් තුමා විසින් සහතික කරනලද වැල්ලවත්තේ 41 වෙනි වෙලුමේ අංක 126 දරන පිටුවේ ලියා පදිංචි ඇති 1905.8.5 දින දරන හිමිකම් සැලැස්මේ අනුව පර්චස් 23 යි දශම 50ක (අ. 0, රූ. 0, ප. 23.50) ප්‍රමාණයෙන් යුත්, බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර මහතා විසින් මෑතදී නැවත මැනීමේදී සකස් කරන ලද අංක 65 හා 1966.4.2 දින දරණ සැලැස්ම අනුව කැබලි තුනක් (වෙන් වෙන්ව පහත විස්තර කරන) සේ, සඳහන්, කොටා ලේන්හි (දැන් සුවිසුද්ධාරාම පාර) වරිපනම් අංක 83 දරන කෝලන්කඩුවේ වත්ත නමැති ලොට් 63 බී දරන ඉඩම එහි තිබෙනා ගස් සහ වැව්ලි සමග

(ඒ) ඉහත කී වැල්ලවත්තේ කොටා ලේන් (දැන් සුවිසුද්ධාරාම පාර) හී පිහිටි ඉහත කී අංක 65 දරණ සැලැස්මේ සඳහන් පර්චස් 17.35 ක් ප්‍රමාණයෙන් යුත් වරිපනම් අංක 83 දරන බිම එහි සෑදීමට සකස් කරන ලද නිවාස දෙකද සමග අංක 63 බී 1 දරණ ඉඩම ;

(බී) පෙරකී වැල්ලවත්තේ කොටා ලේන් (දැන් සුවි සුද්ධාරාම පාර) හී පිහිටි ඉහත කී අංක 65 දරණ සැලැස්මේ සඳහන් පර්චස් එකකින් දශම 65 ක් ප්‍රමාණයෙන් යුත් වරිපනම් අංක 83 සහ ලොට් 63 බී 2 දරණ ඉඩම ;

(සී) පෙර කී වැල්ලවත්තේ කොටා ලේන් (දැන් සුවිසුද්ධාරාම පාර) හී පිහිටි ඉහතකී අංක 65 දරන සැලැස්මේ සඳහන් පර්චස් 05.50 ක් ප්‍රමාණයෙන් යුත් වරිපනම් අංක 83 සහ ලොට් 63 බී3 දරණ ඉඩම.

ඔප්පු පරීක්ෂා කිරීමට සහ වෙනත් විස්තරවලට කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ ජාතික නිවාස කොමසාරිස් තුමාගෙන් විමසන්න.

කේ. ජී. එඩ්මන්,
වෙන්දේසිකරු, බ්‍රෝකර් සහ තක්සේරුකරු.

7, බෙල්මන් වීදිය,
කොළඹ 12.

8–195—70.8.7 දින අංක 14,918 දරන ගැසට් පත්‍රය

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. පෝය දිනවලට පෙරදින පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද, වෙනත් දිනවල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වාද කාර්‍යාලයේ කටයුතු කරන කාලය බව සැළකිය යුතුයි.

4. පෝය දිනවලට පෙරදින දවල් 12 ට සහ වෙනත් දිනවල පස්වරු 3.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත "පිටපත" කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම් පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 20 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. *1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.*

13. 1968.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට | | පිටරට | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| එක් කොටසක් ... ... ... | 46 | 0 | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 36 | 0 | 42 | 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් ... ... | 43 | 50 | 51 | 50 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.**

**තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ | | තැපැල් ගාස්තු මෙරට | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුලතදී එක කොටසක් ... ... ... | 0 | 50 | 0 | 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... ... | 1 | 0 | 0 | 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 | 30 | 0 | 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 | 60 | 0 | 15 |

**දායක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.**

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එව්ය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්‍යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙව්ය යුතුයි.**

### උපලේඛනය

### 1970

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජූනි | 70. 6. 5 සිකුරාද | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| ජූලි | 70. 7. 2 බ්‍රහස්පතින්ද | 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.10 සිකුරාද | 70. 7. 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.17 සිකුරාද | 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.24 සිකුරාද | 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.31 සිකුරාද | 70. 7.24 සිකුරාද | දහවල් | 12.0 |
| අගෝස්තු | 70. 8. 7 සිකුරාද | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 8.14 සිකුරාද | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.21 සිකුරාද | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.28 සිකුරාද | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | 70. 9. 4 සිකුරාද | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.11 සිකුරාද | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.18 සිකුරාද | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.25 සිකුරාද | 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | 70.10. 2 සිකුරාද | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10. 9 සිකුරාද | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.16 සිකුරාද | 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.23 සිකුරාද | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.30 සිකුරාද | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් | 70.11. 5 බ්‍රහස්පතින්ද | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.11.12 බ්‍රහස්පතින්ද | 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.20 සිකුරාද | 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.27 සිකුරාද | 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් | 70.12. 4 සිකුරාද | 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.11 සිකුරාද | 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.18 සිකුරාද | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.24 බ්‍රහස්පතින්ද | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.31 බ්‍රහස්පතින්ද | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 මාර්තු 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රාප්තයි